ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹළා කෙරෙහි පැමිණි කල නුඹළා බලය ලබන්නහුය...." (ක්‍රියා 1 : 8)

85 වන වෙළුම අංක 01 (985) 2026 ජනවාරි / පෙබරවාරි

ඇදහිලිවන්තයා තුල ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය

(ආර්. ඒ. ටෝරි විසිනි) (1856- 1928)

"දෙවියන් වහන්සේ එක්වරක් කීසේක. මම මෙය දෙවරක් ඇසීවි, එනම් බලය දෙවියන් වහන්සේට අයිති බවත්, ස්වාමීනී, කරුණාවත් ඔබට අයිති බවත්ය. එක්නිසාද ඔබ එක එක මනුෂ්‍යයාට ක්‍රියාවේ හැටියට ප්‍රතිඵල දෙනසේක." (ගීතාවලිය 62: 11-12)

ශුද්ධාත්මයාණන් වහන්සේ යනු තනි තනි ඇදහිලිවන්තයාට දෙවියන් වහන්සේට අයිතිව තිබෙන්නාවූ බලය ලබාදෙන තැනැත්වහන්සේය. මෙය ඇදහිලිවන්තයා තුල ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්‍යයයි. එනම්, දෙවියන් වහන්සේට අයත්දේ ගෙන එය අපගේ කරදීමයි. දෙවියන් වහන්සේගේ සියළු ආකාරයේ බලය ක්‍රිස්තුස් වහන්සේ තුල ඔවුන්ගේ අයිතිය ලෙස දෙවියන් වන්සේගේ දරුවන්ට අයත්වේ. නමුත් ක්‍රිස්තුස් වහන්සේ තුල අපගේ උරුමය ලෙස අපට අයත් සියල්ල සැබෑ සහ පර්යේෂණාත්මකව අපගේ බවට පත්වන්නේ පුද්ගලිකව අප තුල ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාව හරහාය.

අපි ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාව තේරුම්ගෙන එය අපටම කියාගන්නා තරමට දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුල අපට සපයා ඇති කිතුණු ජීවිතයේ සහ සේවයේ බලයේ පූර්ණත්වය අපට ලබාගත හැකිය. ශුද්ධාත් -මයාණන් වහන්සේට මනුෂ්‍යයා තුල ක්‍රියාකිරීමට බලය තිබෙන්නේ කෙසේද කියා සොයාගැනීමට අපි දෙවියන් වහන්සේගේ චරිතය අධ්‍යයනය කරමු.

1. යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සහ උන්වහන්සේගේ මහිමය මනුෂ්‍යයාට හෙළිදරව් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තිබෙනසේක.

"එබැවින් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් කරුණුකොටගෙන කථා කරන්නාවූ කිසිවෙක් යේසුස් වහන්සේ ශාපලත් කෙනෙකැයි නොකියන බවත්, ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන විස යේසුස් වහන්සේ ස්වාමීන් වහන්සේයයි කියන්ට කිසිවෙකුට නුපුළුවන් බවත් නුඹළාට දන්වමි."
(1 කොරින්ති 12: 3)

යේසුස් වහන්සේ ආත්මයාණන් වහන්සේගේ පැමිණීම ගැන කථාකල විට උන්වහන්සේ මෙසේ පැවසූසේක, **"නුමුත් පියාණන්වහන්සේ කෙරෙන් මා විසින් නුඹළාට එවන සැනසිලිකාරයාණන් වහන්සේ එනම් පියාණන්වහන්සේ වෙතින් නික්මෙන්නාවූ සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ ආ කල, උන්වහන්සේ මා ගැන සාක්ෂිදෙන්නහුය."** (යොහාන් 15: 26) උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ ගැන සාක්ෂි දරණ ආකාරයටම මනුෂ්‍යයන්ට ක්‍රිස්තුස් වහන්සේ ගැන දැණුමත් ලබාදෙනසේක. ක්‍රිස්තුස් වහන්සේව දැනගැනීම සඳහා අපි මනුෂ්‍යයන්ව දේව වචනය වෙතට යොමු කරන්නෙමු. නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ වචනය රැගෙන එය ආලෝකවත් කලවිට පමණක් මනුෂ්‍යයන්ට ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව සැබෑ ජීවමාන දැණුමක් ලැබෙන්නේය. මනුෂ්‍යයන් යේසුස් වහන්සේ පිළිබඳව සත්‍යය දැනගන්නවාට ඔබ කැමති නම් ඔබේම පැහැදිලි කිරීමේ සහ ඒත්තු ගැන්වීමේ බලයන් මත රඳනොසිට ශුද්ධාත්මයාණන් වහන්සේ වෙතට පැමිණ උන්වහන්සේගේ සාක්ෂිදැරීම සොයන්න.

2. ලෝකයාව පාපය පිළිබඳව වරදකරුවන් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය ඇත.

"උන්වහන්සේ ආ කල, පාපය ගැනද, ධර්මිෂ්ඨකම ගැනද, විනිශ්චය ගැන -ද, ලෝකයාට අඟවාදෙන සේක. පාපය ගැනයයි කීවේ ඔවුන් මා කෙරෙහි නොඇදහි-න නිසාය. ධර්මිෂ්ඨකම ගැනයයි කීවේ මාගේ පියාණන්වහන්සේ ළඟට යන බැවින් තවත් නුඹළා මා නොදක්නා නිසාය. විනිශ්චය ගැනයයි කීවේ වේ ලෝකයේ අධිපතියා විනිශ්චයකරනු ලැබ සිටින නිසාය." (යොහාන් 16: 8-11)

යේසුස් වහන්සේව, උන්වහන්සේගේ මහිමය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පෙන්වීමෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ පාපය, ධර්මිෂ්ඨකම සහ විනිශ්චය පිළිබඳ වරදකරුවන් බව ප්‍රකාශකරයි. ශුද්ධත්මයාණන් වහන්සේ වරදකරුවන් බව ප්‍රකාශකරන පාපය සැලකිල්ලට ගන්න. **"පාපය ගැනයයි කීවේ ඔවුන් මා කෙරෙහි නොඇදහන නිසාය."** ඔබට කිසිවිටෙකත් කිසිම මනුෂ්‍යයෙකු පාපයේ වරදකරුවෙකු කළ නොහැකිය මන්ද එය ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්‍යයයි. ඔබට නැවත නැවත තර්කකල හැකිය. නමුත් ඔබ අසමත්වනු ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේට ඉතා ඉක්මනින් එය කළහැකිය. නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුලින් විශ්වාසය ඇතිකරයි. යොහාන් 16: 7-8 පදවල අපි මෙසේ කියවන්නෙමු, **"එසේවී නුමුත් මම නුඹළාට සැබෑව කියමි, මාගේ අහක්වයාව නුඹළාට ප්‍රයෝජනවත්ය, එක්නිසාද මම අහක්ව නොගියොත් සැනසිලිකාරයාණන් වහන්සේ නුඹළා ළඟට එන්නේ නැත. නුමුත් ගියොත් උන්වහන්සේ නුඹළා වෙතට එවන්නෙමි. උන්වහන්සේ ආ කල, පාපය ගැනද, ධර්මිෂ්ඨකම ගැනද, විනිශ්චය ගැනද ලෝකයාට අඟවාදෙනසේක."** වචනය දේශනා කිරීම, විශ්වාසය ඇතිකිරීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ දෙස බැලීම අපගේ යුතුකමයි. ක්‍රියා 2: 4-37 දක්වා බලන්න.

3. මනුෂ්‍යයන්ව අළුත්කිරීමට හෝ මනුෂ්‍යයන්ව අළුත්කර සෑදීමට, නැවත උත්පාදනය කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය ඇත.

"අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැවති සේදීමෙන්ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ අළුත්කිරීමෙන්ද, උන්වහන්සේ අප ගැළවූසේක."
(තීතස් 3: 5)

නැවත උත්පාදනය යනු ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්‍යයයි. පාප සහ වැරදිවලින් මිය ගොස් සිටින මනුෂ්‍යයෙකුව රැගෙන උන්වහන්සේට ඔහුව නැවත ජීවත්කල හැකිය. දෙවියන් වහන්සේගේ සත්‍යතාවයට අන්ධ මනසක් ඇති, දෙවියන් වහන්සේ සමග සතුරුවී පාපයට නැඹුරුවූ දූෂිත මනුෂ්‍යයාව ගෙනගොස් ඒ මනුෂ්‍යයාව පරිවර්ථනය කර ඔහුට දෙවියන් වහන්සේගේ ස්වාභාවය ලබාදීමට ශුද්ධාත්මයාණන් වහන්සේට හැකිය. එවිට ඔහු දෙවියන් වහන්සේගේ සිතුවිලි වලින් සිතන්නේය. දෙවියන් වහන්සේ කැමතිදේට කැමතිවේ. දෙවියන් වහන්සේ ප්‍රේමකරනු ලබනදේට ප්‍රේමකරනු ලබයි. දෙවියන් වහන්සේ වෛර කරනදේට වෛරකරනු ලබයි. කොයිතරම් දේශනා කලත්, එය කොයිතරම් සාම්ප්‍රදායික වුවත්, වචනය අධ්‍යනය කලත්, ශුද්ධත්මයාණන් වහන්සේ ක්‍රියා නොකරන්නේ නම් නැවත උත්පාදනය සිදුනොවේ. අපව නිදොස් කිරීම සඳහා අප වෙනුවෙන් ක්‍රිස්තුස් වහන්සේ කළාවූ ක්‍රියාව මත සම්පූර්ණයෙන්ම රඳපවතින්නාසේම, නැවත උත්පාදනය සඳහා අපි ශුද්ධතේමයාණන් වහන්සේගේ ක්‍රියාව මත සම්පූර්ණයෙන්ම රැඳිසිටිමු.

4. සදකාලික තෘප්තිය ලබාදීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තිබෙනසේක.

"නුමුත් මා දෙන වතුරෙන් බෙනෙ කවරෙකුට නුමුත් කිසිකලෙක පිපාසා නොවන්නේය. මා ඔහුට දෙන වතුර ඔහු තුළෙහි සදකාල ජීවනය නික්මවන්නාවූ වතුර උල්පතක් වන්නේයයි කීසේක." (යොහාන් 4:14) **"මංගල්‍යයේ මහත් දවසවූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වමින්, යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ. මා කෙරෙහි අදහන්නා තුලින් ලියවිල්ලෙහි කියාතිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක. උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. එක්නිසාද යේසුස් වහන්සේ ඒතාක්ම මහිමයට නොපැවිණී බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙනලද්දේය."**
(යොහාන් 7: 37-39)

ජලය යන්නෙන් අදහස් කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේව වනසේක. ලෝකය කිසිදු තෘප්තිමත් කළනොහැකිය. සෑම ලෞකික ප්‍රීතියක් ගැනම මෙසේ පැවසිය යුතුය. **"වේ වතුරෙන් පානය කරන ඕනෑම කෙනෙකුට නැවත පිපාසා වන්නේය."** නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේට ආත්මයේ සෑම ආශාවක්ම තෘප්තිමත් කිරීමට බලය ඇත.

2 පිටුවට

1 පිටුවෙන්

ඇදහිලිවන්තයා තුල ශුද්ධාත්මයාණ..

ශුද්ධාත්මයාණන් වහන්සේට පමණක් මනුෂ්‍යයාගේ හදවත තෘප්තිමත් කළහැකිය. ඔබ ඔබගේ හදවත තුල ශුද්ධාත්මයාණන් වහන්සේට ගළා ඒමට හෝ ඉහළට නැගීමට ඔබව භාරදුන්නොත් ඔබට කිසිදුක පිපාසයක් ඇති නොවේ. ආත්මයාණන් වහන්සේ බොහෝ දෙනාගේ හදවත් තුල තම ජීවමාන ජලය වත්කර ඇත්තේ කොයිතරම් විස්තර කළනොහැකි ප්‍රීතියකින් සහ තෘප්තියකින්ද? ඔබ තුල මේ ජීවමාන උල්පත තිබේද? උල්පත වැසී තිබෙනවාද?

5. පාපයේ සහ මරණයේ නීතියෙන් අපව නිදහස් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය ඇත.

"එක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන් වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළාය." (රෝම 8:2)

පාපයේ සහ මරණයේ ව්‍යවස්ථාව අපි සියළුදෙනාම දැනසිටින්නෙමු. අපි හැමෝම එයට වහල්ව ඉඳළා තියෙනවා. අප අතරෙන් සමහරෙක් තවමත් ඊට වහල්ව සිටිනවා. නුමුත් අපි එහෙම වෙන්න අවශ්‍යය නැහැ. දෙවියන් වහන්සේ ගැළවීමේ මාර්ගයක් සපයාදී ඇත. ඒ මාර්ගය ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරුණුකොටගෙන සපයාදී තිබෙනසේක. පාපයේ සහ මරණයේ ව්‍යවස්ථාවෙන් ජයගැනීමට උත්සහකිරීමෙන් බලාපොරොත්තු රහිතව පොරබැදිමින් සිටීම, අපගේ ශක්තියෙන්, මාංශයේ බලයෙන් නිවැරදිව ජීවත්වීමට උත්සහකිරීම සහ සම්පූර්ණයෙන්ම අසරණව සිටීම සිදුවීඇත. නුමුත් අප වෙනුවෙන් සියල්ල කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට යටහත් වෙමින්, අපි උන්වහන්සේ පසුපස යනවිට සහ උන්වහන්සේගේ ආශිර්වාදලත් බලයෙන් ජීවත්වනවිට උන්වහන්සේ පාපයේ සහ මරණයේ ව්‍යවස්ථාවෙන් අපව නිදහස් කරනසේක.

රෝම 7: වන පරිච්ඡේදයේ අද බොහෝ කිතුණුවන් ජීවත්වෙති. සමහරු මෙය සාමාන්‍ය ජීවිතය බවත්, මෙය නිරන්තර පරාජිත ජීවිතයක කළයුතු දෙයක් බවත් කියා සිටිති. අපව අපටම භාරදුන්නොත් එය සත්‍යය වනු ඇත. මන්ද අප තුලම අපි පාපයට යටත්ව විකුණනු ලැබේ. නමුත් අපව අපටම භාරදී නැත. අප විසින්ම කිරීමට අපොහොසත්වූ දේ ශුද්ධාත්මයාණන් වහන්සේ අප වෙනුවෙන් භාරගන්නා සේක. (රෝම 8:2-4)

රෝම 8: වන පරිච්ඡේදයේ අපට සැබෑ කිතුණු ජීවිතය පිළිබඳ චිත්‍රයක් ලබාදී ඇත. එය අපට ගතකලහැකි ජීවිතය සහ දෙවියන් වහන්සේ අප සෑම කෙනෙකුගෙන්ම අපේක්ෂා කරන ජීවිතයයි. රෝම 7: වන පරිච්ඡේදයේ මෙන් ආඥාව පමණක් නොව, බලවත් ආත්මයාණන් වහන්සේ පැමිණ කීකරුකම සහ ජයග්‍රහණය ක්‍රියාත්මක කරනසේක. මාංශය තවමත් අපතුල ඇත. නමුත් අපි මාංශයෙහි ජීවත් නොවන්නෙමු. අපි ආත්මයාණන් අනුව ජීවත් වන්නෙමු. අපි ආත්මයාණන් තුලින් ශරීරයේ ක්‍රියා නසන්නෙමු. (රෝම 8: 13) **"නුවුත් ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන හැසිරියල්ලා, එවිට නුඹළා මාංශයේ තෘෂ්ණා සම්පූර්ණ කරන්නේ නැතැයි කියමි."** (ගලාති 5: 16)

ආත්මයාණන් වහන්සේගේ බලයෙන් මාංශයට හා පාපයට එරෙහිව දිනපතා සහ සෑම පැයකදීම (සෑම මොහොතකදීම) නිරන්තර ජයග්‍රහණය ලබාගැනීම අපගේ වරප්‍රසාදයයි. නමුත් එම ජයග්‍රහණය අප තුලින්ම නොවේ. අපගේම කිසිදු ශක්තියකින් නොවේ. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගෙන් ඇත්වී අපගේම ශක්තිය මත රැඳුනොත් අපි සෑමවිටම අසරණවනු ඇත. මුළු ජයග්‍රහණය පැමිණෙන්නේ ආතමයාණන් වහන්සේගේ බලයෙනි.

ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබව පාපයේ සහ මරණයේ ව්‍යවස්ථාවෙන් නිදහස්කර තිබේද? දැන් ඔබ එය ඉටුකිරීමට උන්වහන්සේට ඉඩදෙනවාද? පාපයේ සහ මරණයේ ව්‍යවස්ථාවෙන් නිදහස්වීමට සහ පවිකිරීම අත්හැරීමට දරණ තමාගේම උත්සහයන් අත්හරින්න. ඔබව නිදහස් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ දිව්‍ය බලය විශ්වාස කරන්න. එය කිරීමට ඔබ උන්වහන්සේට භාරවෙන්න. උන්වහන්සේ එය ඉටුකරනසේක. එවිට ඔබට පාවුල් සමග ජයග්‍රාහිකව මෙලෙස මොරගැසිය හැකිය. **"එක්නිසාද ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන් වහන්සෙගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළාය"** (රෝම 8: 2)

6. ශුද්ධාත්මයාණන් වහන්සේ ඇදහිලිවන්තයාව අභ්‍යන්තර මනුෂ්‍යයා තුල බලයෙන් ශක්තිමත් කරනසේක.

"උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන නුඹළාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹළා බලයෙන් ශක්තිමත් වන පිණිසත්," (එපීස 3: 16) මෙම ශක්තිමත් කිරීමේ ප්‍රතිඵලය එපීස 3:17-19 දක්වා පදවල දකින්නට ලැබේ. මෙහිදී ආත්මයාණන් වහන්සේගේ බලය ප්‍රකාශවන්නේ පාපයට එරෙහිව අපට ජයග්‍රහනය ලබාදීමෙන් පමණක් නොව ක්‍රිස්තුස් වහන්සේ අපගේ හදවත් තුල වාසය කිරීම, ප්‍රේමයෙන් මුල්ඇද පිහිටාසිටීම, එම ප්‍රේමයෙහි පළල, දිග, උස, ගැඹුර කුමක්ද කියා සියළු ශුද්ධවන්තයන් සමග දැනගැනීමට හැකිවීම. ඒ සියල්ල අවසාන වන්නේ අපගේ දෙවියන් වහන්සේගේ සියළු පූර්ණත්වයෙන් පිරීසිටීම තුලවේ.

7. අපව ශුද්ධ ජීවිතයකට, දෙවියන් වහන්සේගේ පුත්‍රයන් ලෙස ජීවත්වීමට, දෙවියන් වහන්සේට සමානවන ජීවිතයකට අපව රැගෙනයාමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය ඇත.

"එක්නිසාද දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ විසින් ගෙනයනු ලබන යම්පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය." (රෝම 8: 14)

ශුද්ධත්මයාණන් වහන්සේ අපට ශුද්ධවූ ජීවිතයක් ගතකිරීමට බලය ලබාදෙන්නේ දෙවියන් වහන්සේට ප්‍රසන්න ජීවිතයක් ගතකිරීමට පමණක් නොවේ. එම ජීවිතය කුමක්දැයි සොයාගත් විට උන්වහන්සේ අපව අතින් අල්ලාගෙන එම ජීවිතයට ගෙනයනසේක. අපගේ මුළු කාර්‍ය්‍යය නම්, අපව මෙහෙයවීමට සහ හැඩගැස්වීමට උන්වහන්සේට සම්පූර්ණයෙන්ම යටත්වීමයි.මෙය ඉටුකරන සියළු මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ දරුවන් පමණක් නොවේ. (ක්‍රියා 17:28) ඔවුන් දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8: 14)

8. ශුද්ධාත්මයාණන් වහන්සේ ඇදහිලිවන්තයාගේ ආත්මය හා එක්ව ඔහු දෙවියන් වහන්සේගේ දරුවෙකු බව සාක්ෂි දරණසේක.

"අපි දෙවියන් වහන්සේගේ දරුවෝයයි ආත්මයාණන් වහන්සේ අපේ ආත්මය එක්ව සාක්ෂිදෙනසේක." (රෝම 8 : 16)

ආත්මයාණන් වහන්සේ අපගේ ආත්මයට සාක්ෂි දරන්නේයයි පාවුල් නොකියන බව සලකන්න. නුමුත් ඒ හා සමග **"අපගේ ආත්මය හා එක්ව"** යනු භාවිතාකර තිබෙන වචනවල නිශ්චිත බලයයි. අපගේ පුත්‍රකමට සාක්ෂිදරණ දෙදෙනෙක් සිටිති. පළමුව අපගේ ආත්මය අප දෙවියන් වහන්සේගේ දරුවන් බව සාක්ෂිදරයි. දෙවනුව ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ ආත්මය හා එක්ව අප දෙවියන් වහන්සේගේ දරුවන් බව සාක්ෂිදරයි. මෙම කාරණයට ශුද්ධාත්මයාණන් වහන්සේ සාක්ෂිදරන්නේ කෙසේද? ගලාති 4: 6 වන පදයේ මෙම ප්‍රශ්ණයට පිළිතුරු සපයාදී ඇත.

9. ශුද්ධාත්මයාණන් වහන්සේ ඇදහිලිවන්තයා තුලට ක්‍රිස්තුස් වහන්සේගේ චරිතයට සමාන කරුණාවේ චරිත ගුණාංග ගෙනඒනසේක.

"නුවුත් ආත්මයාණන් වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදනය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණදැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත." (ගලාති 5: 22-23)

අප තුල ඇති සියළු අලංකාරවූ චරිත ලක්ෂණ සියළු ආකාරයේ ක්‍රිස්තුස් වහන්සේගේ සමානකම ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාවයි. එය උන්වහන්සේගේ ඵලවන අතර එම ඵල දරාසිටින්නේ අප නොව උන්වහන්සේ වනසේක. මෙම ජීවිතය අපට ස්වාභාවික එකක් නොවන අතර එය මාංශයේ හෝ ස්වාභාවික කිසිඳු උත්සහයකින් ලබාගත නොහැකිය. ස්වාභාවික ජීවිතය ගලාති පොතේ කලින් පදතුනේ සඳහන් කරඇත. (ගලාති 5:19-21) නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේට වාසය කිරීමට සම්පූර්ණ ඉඩලබාදෙන විට මාංශයේ විනාශකාරී නපුරු ස්වාභාවය අපට අවබෝධකර දෙනසේක. එහි බලයෙන් සැබවින්ම යහපත් දෙයක් කිසිදුක අත්කර ගැනීමට හැකිවේයයි බලාපොරොත්තු වියනොහැකිය. අවසානයේදී අපගේ ජීවිත සහ අපගේ සියළුම කාර්‍ය්‍යන් අපතුල වාසය කරන ශුද්ධාත්මයාණන් වහන්සේට භාරදුන්විට ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාභාවය වන ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵල අප තුල හටගන්නේය. මෙය ආත්මයාණන් වහන්සේගේ විශුද්ධ කිරීමයි. (1 පේ්‍රතුස් 1: 2, 2 තෙසලෝනික 2: 13)

10. ඇදහිලිවන්තයාව මුළු සත්‍යයකරා මගපෙන්වීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තිබෙනසේක.

"එසේවී නුවුත් උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන් වහන්සේ ආ කල උන්වහන්සේ ඵළු සත්‍යය කරා නුඹළාට මග පෙනවන සේක. එක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථානොකර, උන්වහන්සේ අසනදේ කියා, පැවිශේනට තිබෙනදේ නුඹළාට ප්‍රකාශකරන සේක." (යොහාන් 16: 13)

අපගේ ගුරුවරුන් වන මනුෂ්‍යයන් කොපමණ සිටියත්, ඔවුන් කවුරුන් වුවත් සත්‍යය පිළිබඳව මනුෂ්‍යය ඉගැන්වීම් වලින් නිවැරදි අවබෝධයක් අපට ලබාදීමට නොහැකිය. ඉංග්‍රීසි හෝ මුල් භාෂාවලින් වචනය කඩිසරව අධ්‍යයනය කිරීමෙන් පවා සත්‍යය පිළිබඳව අපට සැබෑ අවබෝධයක් ලබාගත නොහැකිය. අපට ශුද්ධාත්මයාණන් වහන්සේ තුලින් ඉගැන්විය යුතුය. එමෙන්ම අප සෑම කෙනෙකුටම ඉගැන්වීමට උන්වහන්සේට හැකිව සිටිනසේක.

11. ශුද්ධාත්මයාණන් වහන්සේට ක්‍රිස්තුස් වහන්සේගේ වචන මතකයට ගෙනඒමට බලය තිබෙනසේක.

"නුවුත් මාගේ නාමයෙන් පියාණන් වහන්සේ එවන සැනසිලිකාරයාණන් වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ, නුඹළාට සියල්ල උගන්වමින්, මා විසින් නුඹළාට කියනලද සියල්ල නුඹළාට සිහිකරවනසේක." (යොහාන් 14: 26)

මෙම පොරොන්දුව ප්‍රධාන වශයෙන් ප්‍රේරිතයන්ට දෙනලද අතර යේසුස් වහන්සේ පැවසූ දේ පිළිබඳ ඔවුන්ගේ වාර්ථා නිරවද්‍යතාවය පිළිබඳ සත්‍යයකි. නුමුත් ශුද්ධත්මයාණන් වහන්සේ එය ඉටුකිරීමට උන්වහන්සේ දෙස බලන සහ අපේක්ෂා කරන සෑම ඇදහිල්වන්තයෙක් සමගම සමාන කාර්‍ය්‍යයක් කරනුලබනසේක. අපගේ ජීවිතයේ අවශ්‍යතා සඳහා හෝ අපගේ සේවය සඳහා ඒවා අවශ්‍යයවූ විට උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ වචන සහ ඉගැන්වීම් මතකයට ගෙනඑනසේක.

12. ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවල් අපට අණාවරණය කරනසේක. ඒවා සැඟවීඇති අතර ඒවා ස්වාභාවික මනුෂ්‍යයාට මෝඩකමකි. උන්වහන්සේම එළිදරව් කරනදේ ගැන අර්ථකතනය ලබාදෙයි. නැතහොත් උන්වහන්සේ ඉගැන්වූදේ දැනගැනීමට, තේරුම් ගැනීමට, අගයකිරීමට, බලය ලබාදෙනසේක.

"නුවුත් දෙවියන් වහන්සේ ස්වකීය ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන අපට ඒ දේ එළිදරව් කළසේක. එක්නිසාද ආත්මයාණන් වහන්සේ සියළු දේ එසේය, දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවල් විමසනසේක. මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුල තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවෙරෙක් දන්නේද? එසේම දෙවියන් වහන්සේගේ කාරණා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විස වෙන කිසිවෙක් නොදනියි. නුවුත් දෙවියන් වහන්සේ විසින් අපට දෙනලද දේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන් වහන්සේගෙන්වූ ආත්මය ලැබීවුව. අප විසින් ඒ දේවල් කථාකරන්නෙත්

3 පිටුවට

මනුෂ්‍යය ප්‍රඥාව කරුණු කොටගෙන උගන්වනලද වචන

2 පිටුවෙන්

ඇදහිලිවන්තයා තුල ශුද්ධාත්මයාණ..

වලින් නොව ආත්මික දේවල් ආත්මිකදේ සමග සමානකර බලමින් ආත්මයාණන් වහන්සේ විසින් උගන්වනලද වචනවලින්ය. නුමුත් ජවිමික මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ කාර්‍යය පිළිනොගනියි ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය." (1 කොරින්ති 2: 10-14)

ශුද්ධාත්මයාණන් වහන්සේ, එළිදරව් කිරීමේ කතෘවරයා පමණක් නොව, දෙවියන් වහන්සේගේ ලිඛිත වචනයේ උන්වහන්සේ එළිදරව් කළදේ අර්ථකතනය ලබාදෙන්නාද වනසේක. අපට අර්ථකතනය ලබාදීමට පොතේ කතෘවරයා අප අතර සිටිනවිට ඕනෑම ගැඹුරු පොතක් කොයිතරම් රසවත් හා ප්‍රයෝජනවත් වේවිද? අපි බයිබලය අධ්‍යනය කරනවිට අපට සෑමවිටම තිබිය යුත්තේ මෙයයි. කතෘවරයා ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේ අර්ථකතනය වඩාම නිවැරදි ආකාරයෙන් ලබාදෙනසේක. බයිබලය තේරුම්ගැනීමට නම් අපි ශුද්ධාත්මයාණන් වහන්සේ දෙස බැලියයුතුය. එවිට වැසීතිබෙන ස්ථාන පැහැදිලිවේ. අපි මෙලෙස යාච්ඤා කළයුතුය. **"ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්‍යීමත් දේ දකින්නා පිණිස මාගේ ඇස් පහදුව මැනව."** (ගීතාවලිය 119: 18)

ලිඛිත වචනය තුල අපට අරමුණ එළිදරව්වී තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. අපට එය තේරුම්ග ැනීමට හැකිවන පරිදි ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභ්‍යන්තර ආලෝකකරණය තිබියයුතුය. ස්වාභාවික අවබෝධයෙන් අධ්‍යාත්මික එළිදරව්වක් තේරුම් ගැනීමට උත්සහකිරීම විශාල වැරැද්දකි. දෙවියන් වහන්සේගේ වචනය තේරුම්ගැනීමට නම් අපි අපගේම ප්‍රඥාවෙන් සම්පූර්ණයෙන්ම හිස්විය යුතු අතර අපට අර්ථකතනය කිරීමට දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ මත සම්පූර්ණයෙන්ම යැපෙමින් රැඳිසිටිය යුතුය. අපි අපගේම ප්‍රඥාව මත රැඳිසිටීම ඉවතදැමූවිට පමණක් දෙවියන් වහන්සේගේ ප්‍රඥාව අපට ලැබේ. (1 කොරින්ති 3: 10, 1: 25-28, මතෙව් 11: 5)

13. ශුද්ධාත්මයානන් වහන්සේ විසින් ඇදහිලිවන්තයාට උගන්වා ඇති සත්‍යතාවය බලයෙන් යුක්තව අනිත් අයට සන්නිවේදනය කිරීමටහැකියාව ලබාදෙනසේක.

"ඒ හැටියට සහොදරයෙනි, මා නුඹළා වෙතට ආ කල්හී දෙවියන් වහන්සේගේ රහස නුඹළාට එළිදරව් කරමින් ආවා විස කථාවෙවත් ප්‍රඥාවෙවත් උතුම්කමින් යුක්තව නාවෙමි. මක්නිසාද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේ කුරුසියෙහි ඇණගසනු ලැබූ බවත් විස වෙන කිසිවක් නුඹළා අතරෙහි නොදැන සිටීන්ට නියම කරගතිමි. මම දුර්වලකමින්ද, භයින්ද, බොහෝ වෙවුළුවෙන්ද, නුඹළා සමග සිටියෙමි. මාගේ කථාවත්, මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන් වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ නුඹළාගේ ඇදහිල්ල දෙවියන් වහන්සේගේ බලයෙන් විස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොසිහිටන පිණිසය." (1 කොරින්ති 2:1-5)

ප්‍රථමයෙන්ම සත්‍යතාවය අපට එළිදරව් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේව අවශ්‍යය වන අතර, දෙවනුව උන්වහන්සේ හෙළිදරව් කළාවූ සත්‍යතාවයේ අර්ථකතනය ලබාදීමටද උන්වහන්සේව අවශ්‍යය වන්නේය. එපමණක් නොව තුන්වෙනුව, උන්වහන්සේ අපට අර්ථකතනය කළාවූ සත්‍යතාවය ඵලදායි ලෙස අන් අයට සන්නිවේදනය කිරීමට අපට හැකියාව ලබාදීමටද ශුද්ධාත්මයාණන් වහන්සේව අවශ්‍යය වනසේක. අපට සෑමදෙයකටම උන්වහන්සේව අවශ්‍යය වන්නේය.

ශුද්ධාත්මයාණන් වහන්සේ ඉගැන්වූදේ මනුෂ්‍යයාගේ ප්‍රඥාවෙන් පොළඹවමින්, මනුෂ්‍යය තර්ක විතර්ක මත ඉගැන්වීමට උත්සහ දැරීමෙන් දේව සේවයේදී පමණක් නොව කිතුණු පුරුෂයන් හා ස්ත්‍රීන් විසින් කරනුලබන සියළුම ආකාරයේ සේවාවන් වලදී සාර්ථකත්වය පෙනෙන්නට තිබියදීත් අසාර්ථකවීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේය. අවශ්‍යය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයයි. ආත්මයාණන් වහන්සේ සහ උන්වහන්සේගේ බලය නිරූපණය වියයුතුය. උන්වහන්සේ අපට කථාකල ආකාරයෙන්ම, කථාකළයුතු දේද ඉගැන්විය යුතුය. උන්වහන්සේ පණිවිඩයමෙන්ම බලයද වියයුතුය.

14. ශුද්ධාත්මයාණන් වහන්සේ ඇදහිලිවන්තයාට යාච්ඤාකිරීම තුල මගපෙන්වනසේක.

"නුවුන් ප්‍රේවවන්තයෙනි, නුඹළා වනාහී නුඹළාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹළාව ගොඩනගා ගනිමින්, ශුද්ධාත්වයාණන් වහන්සේ තුල සිට යාච්ඤාකරමින් සදකාල ජීවනය පිණිස අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දයාව බලාසිටිමින්, දෙවියන් වහන්සේගේ ප්‍රේවයෙහි පැවතියල්ලා." (යූදස් 1: 20-21)

ගෝලයන් යාච්ඤා කිරීමට නොදැන සිටිනිසා ඔවුන් යේසුස් වහන්සේ වෙතට පැමිණ මෙසේ කීවෝය. **"..., ස්වාමීනී, යොහාන් තවන්ගේ ගෝලයන්ට ඉගැන්වූවාක්මෙන් අපටත් යාච්ඤාකරන්ට ඉගැන්නුව මැනවයි කීවේය."** (ලූක් 11: 1) **"...,එක්නිසාද යුතුලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව..."** (රෝම 8: 26) එමෙන්ම අපට උපකාර කිරීමට තවත් උපකාරකයක් අප ළඟ සිටිනසේක. (යොහාන් 14: 16-17) **"එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරනසේක..."** (රෝම 8: 26) යාච්ඤා කිරීමට උන්වහන්සේ අපට උගන්වනසේක.

සැබෑ යාච්ඤාව ආත්මයාණන් වහන්සේ තුල යාච්ඤා කිරීමයි. එනම් ආත්මයාණන් වහන්සේගේ ආනුභාවය සහ මෙහෙයවීම ඇති යාච්ඤාවයි. අපි යාච්ඤා කිරීමට දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයට පැමිණෙනවිට අපගේ දුර්වලතාවයත්, අප යාච්ඤා කළයුත්තේ කුමක් සඳහාද හෝ අපි යාච්ඤා කළයුත්තේ කෙසේදයන්න පිළිබඳව අපගේ නොදැනුවත්කම සහ නිවැරදිව යාච්ඤා කිරීමට අපගේ සම්පූර්ණ නොහැකියාව පිළිබඳව අවබෝධ කරගැනීම තුල ශුද්ධාත්මයාණන් වහන්සේ දෙස බලා අපගේ යාච්ඤාව මෙහෙයවීමට, අපගේ ආශාවන් පිටතට ගෙනඒමට සහ ඒවා ප්‍රකාශකිරීමට මගපෙන්වන ලෙස උන්වහන්සේට සම්පූර්ණයෙන්ම අපවම භාරදියයුතුය. අපි ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණෙනතෙක් බලාසිටිය යුතු අතර ශුද්ධාත්මයාණන් වහන්සේට අපවම යටත් කළයුතුය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවය ලැබූ දෙවියන් වහන්සේට කරන යාච්ඤාව යනු පියාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ පිළිතුරු ලබාදෙන යාච්ඤාවයි.

15. ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ස්තුති කිරීමට උගන්වන සේක.

"මුද්‍රිකපානයෙන් මත් නොවෙල්ලා, එයින් අනාචාරකම් හටගන්නේය. නුමුත් ආත්මයාණන්ගෙන් පූර්ණවී, ගීතිකාවලින්ද, කවිවලින්ද, ආත්මික ගීවලින්ද එකිනෙකාට කථාකොට නුඹළාගේ සිත්වලින් ස්වාමීන් වහන්සේට ගායනාද ගීතිකාද කරමින් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් සියළු දේ ගැන පියවූ දෙවියන් වහන්සේට නිතරම ස්තුති කරපල්ලා" (එපීස 5: 18-20)

16. ක්‍රිස්තුස් වහන්සේ තුල සිටින ඇදහිලිවන්තයෙකුගේ හදවතෙහි දෙවියන් වහන්සේට පිළිගතහැකිවූ නමස්කාරයක් ඇතිකිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තිබෙනසේක.

"මක්නිසාද චර්මඡේදිනයෝ නම් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් කරුණුකොටගෙන නමස්කාරකරන්නාවූ, ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුල පාරවිටුකරගන්නාවූ, මාංශය තුල විශ්වාසයක් නැත්තාවූ අපිය." (පිලිප්පි 3: 3)

නමස්කාරය යනු මැවිල්ල තුල දෙවියන් වහන්සේට ඇති සම්බන්ධතාවයේ නිශ්චිත ක්‍රියාවකි. නමස්කාරය යනු දෙවියන් වහන්සේ ඉදිරියේ හිසනමා ආචාරකිරීම සහ උන්වහන්සේව පිළිගැනීමයි. යම්කෙනෙක් මෙසේ පවසා ඇත.

"අපගේ යාච්ඤාවලදී අපි අපගේ අවශ්‍යයතාවයන් වලින් පිරිසිටින්නෙමු. අපගේ නමස්කාරයේදී අපි උන්වහන්සේගෙන් පිරිගියෙමු." ශුද්ධාත්මයාණන් වහන්සේ පොළඹවන සහ මෙහෙයවන දේ හැර සැබෑ සහ පිළිගතහැකි නමස්කාරයක් නොමැත.

17. අපට මගපෙන්වීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තිබෙනසේක.

"ඔවුන් ස්වාමීන් වහන්සේට වෙහෙකරමින් උන් කල, ශුද්ධාත්වයාණන් වහන්සේ කථාකොට, මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් වට වෙන්කරපල්ලායයි කීසේක. එවිට ඔවුහු නිරාහාරයෙන් හිඳ යාච්ඤාකොට ඔවුන් පිට අත්තබා ඔවුන් පිටත්කර හැරියෝය. වෙසේ ඔවුහු ශුද්ධාත්වයාණන් විසින් යවන ලදුව සිලුකියට බැසගොස් එහිදී නැවිනැගී කුප්‍රසයට ගියෝය." (ක්‍රියා 13: 2-4) **"එවිට ආත්මයාණන් වහන්සේ පිලිප්ට කථාකොට, නුඹ වේ රථය ළඟට ගොස් එක්වෙයන්නැයි කීසේක."** (ක්‍රියා 8: 29)

ශුද්ධාත්මයාණන් වහන්සේ මනුෂ්‍යයන්ව කැඳවා නිශ්චිත වැඩකටයුතු සඳහා ඔවුන්ව පිටත්කර යවනසේක. ශුද්ධාත්මයාණන් වහන්සේගේ කැඳවීම අපි ලබාගන්නේ කෙසේද? එයට ආශාකිරීමෙන්, එය සෙවීමෙන්, ඒ සඳහා ස්වාමීන් වහන්සේ කෙරෙහි බලාසිටීමෙන් සහ එය අපේක්ෂා කිරීමෙන්ය. දෙවියන් වහන්සේ බොහෝ විට නිශ්චල කුඩා හඬකින් කථාකරනසේක. සවන්දෙන්නාවූ කන්වලට පමණක් එය ග්‍රහනය කරගතහැකිවේ.දෙවියන් වහන්සේ කැමති තැනකට ඔබව යැවීමට ඔබම දෙවියන් වහන්සේට කැපවී තිබෙනවාද? දෛනික ජීවිතයේ සහ සේවයේ විස්තරවලදී යායුත්තේ කොතැනටද, නොයායුත්තේ කොතැනටද, කළයුත්තේ කුමක්ද, නොකළයුත්තේ කුමක්ද, යන්න පිළිබඳව ශුද්ධාත්මයාණන් වහන්සේ මගපෙන්වනසේක. අපගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම ශුද්ධාත්මයාණන්ගේ නොවරදින මගපෙන්වීම අපට ලබාගතහැකිය.

18. ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂිදීමේදී අපට නිර්භීතකම ලබාදීමට ශුද්ධාත්මයාණන් වහන්සේට බලය තිබෙනසේක.

"ඔවුන් යාච්ඤාකළ පසු, ඔවුන් රැස්වසිටි ස්ථානය කම්පාවිය. ඔවුන් සියල්ලෝද ශුද්ධාත්මයෙන් පූර්ණව, දෙවියන් වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථාකළෝය." (ක්‍රියා 4: 31)

බොහෝදෙනෙක් ස්වාභාවයෙන්ම ලැජ්ජාශීලීය. ඔවුන් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් යමක් කිරීමට ආශාවෙති. නුමුත් ඔවුන් භියවෙති. ඔබ උන්වහන්සේ දෙස බලා උන්වහන්සේ එය කරනබව විශ්වාස කරන්නේ නම්, ශුද්ධාත්මයාණන් වහන්සේට ඔබව නිර්භීත කළහැකිය.

දෙවියන් වහන්සේගේ පරිපූර්ණ සැපයීම

ඇදහිලිවන්තයා තුල ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පිළිබඳව පවසා ඇති දේවලින් කරුණු දෙකක් පැහැදිලිවේ. පළමුව, කිතුණු ජීවිතයේ සහ සේවයේ සෑම හැරීමකදීම අපි ශුද්ධාත්මයාණන් වහන්සේ මත කොයිතරම් සම්පූර්ණ ලෙස පවතිනවාද යන්න සහ දෙවනුව, දෙවියන් වහන්සේ විසින් ජීවිතය සහ සේවය සඳහා සපයා ඇති සැපයුම කොයිතරම් පරිපූර්ණද සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්‍යය තුලින් නිහතමානී ඇදහිල්වන්තයාට හිමිවන වරප්‍රසාදයේ පූර්ණත්වය කුමක්ද යන්නයි. වැදගත් වන්නේ ස්වාභාවයෙන්ම අපි කෙබඳුද යන්න නොව ශුද්ධාත්මයාණන් වහන්සේට අප වෙනුවෙන් කළහැකි දේ සහ අපි උන්වහන්සේට ඉඩදෙන ප්‍රමාණයයි.

කිතුණු ජීවිතය ස්වාභාවිකව සාමාන්‍යය ක්ෂේත්‍රය තුල ගතකළයුතු දෙයක් නොවන අතර කිතුණු කාර්‍යයන් ස්වාභාවික දායාදයේ බලයෙන් කළයුතු දෙයක්ද නොවේ. නුමුත් කිතුණු ජීවිතය ආත්මයාණන් වහන්සේගේ ක්ෂේත්‍රය තුල ගතකළයුතු අතර කිතුණු කාර්‍යයන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් කළයුතුය. ශුද්ධත්මයාණන් වහන්සේ අප සෑම කෙනෙකු තුලම උන්වහන්සේගේ මුළු කාර්‍යය ඉටුකිරීමට ආශාවෙන් සිටිනසේක. අපි උන්වහන්සේට ඉඩදෙන සියල්ල උන්වහන්සේ අපි සෑමකෙනෙකුටම ඉටුකරදෙනු ලබනසේක.

ස්වාමීනී ඔබගේ ආත්මයෙන් පිරී ඉතිරී යනලෙස අපව පිරෙව්ව මැනව

(රිව් කාර්මයිකල් විසිනි)

ශුද්ධාත්මයාණන් වහන්සේගේ පුද්ගලිකත්වය සහ සේවයත් උන්වහන්සේගේ පැමිණීම සහ බලයත් අපගේ ජීවිත තුල සහ ඒ තුලින් ඇතිකළ හැකි බලපෑම කෙරෙහි අවධානය යොමුකිරීමට ලැබීමත් කොයිතරම් ආශිර්වාදයක්ද? පෙරමග දූතයා මෙම කලාපයේ විවිධ ලිපිවල පෙන්වාදෙන පරිදි එම බලපෑම තුල ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ මහිමය අපට හෙළිදරව් කිරීම, පාපය පිළිබඳ අපගේ වරද හඟවාදීම හා එයින් නිදහස් කිරීම අධ්‍යාත්මික සත්‍යයන් කරා අපව මෙහෙයවීම ශුද්ධ ජීවිතයක් ගතකිරීමට සහ ක්‍රිස්තුස් වහන්සේට සමානවීමට ඉඩසැලසීම, අපව අළුත් කිරීම සහ අධ්‍යාත්මික ජීවිතයෙන් පිරීඉතිරියාම, අපව ආලේපකිරීම සහ දේවසේවයේ නිර්භීත ලෙස හා ඵලදායී කිරීම, යාච්ඤාවෙන් අපව මෙහෙයවීම සහ බලගැන්වීම, අපතුල ප්‍රේමය, ප්‍රීතිය, සමාදනය, යනාදියෙහි ඵලදැරීමට සැලැස්වීම ඇතුලත්වේ.

"සේවය සඳහා ආත්මයාණන් වහන්සේගේ බලය" යන ලිපියෙන් ඩී. එල්. මූඩි අපගේ ජීවිතවල ආත්මයේ වර්ධනය සඳහාවූ හැකියාව පිළිබඳ මෙම උද්යෝ -ගීමත් චිත්‍රය අපට ලබාදෙයි. ජීවමාන ජලයෙන් පිරීසිටින කෙනෙකු දැකීමට මම කැමැත්තෙමි. ඔවුන්ට එය දරාගත නොහැකි තරමට පිරීගොස් දෙවියන් වහන්සේගේ කරුණාවේ සුභාරංචිය ප්‍රකාශයට පත්කිරීමට හැකිවනලෙස පිරියනු දැකීමට මම කැමැත්තෙමි. දෙවියන් වහන්සේගේ ආත්මය අප මතරැඳී සිටියයුතුය. එවිට අපට ලෝකයෙන්, මාංශයෙන් සහ යක්ෂයාගෙන් ජයගතහැකිය. ඩී. එල්. මූඩි අපට මතක්කර දෙන්නේ ස්වර්ගයේ මිණුම ඔබමින්, සොලවමින්, උතුරායන්නට දෙන හොඳ මිණුමක් බවයි. (ලූක් 6: 38) ඔහු තවදුරටත් අසන්නේ ඔබට මේ පූර්ණත්වය තිබෙනවාද කියාය. එය නොමැති නම් එය සොයන්න. දෙවියන් වහන්සේගේ කරුණාවෙන් ඔබට එය ලැබෙන බව පවසන්න. මක්නිසාද මේ දේවල් අපට ලබාදීමට පියාණන් වහන්සේ ප්‍රසන්න වනසේක. (ලූක් 12: 32)

ඇන්ඩ්‍රෲ මරේ අපගේ ජීවිතවල ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්‍ය්‍යය කෙරෙහි අවධානය යොමුකරයි. ශුද්ධාත්මයාණන් වහන්සේ, පියාණන්වහන්සේගේ සහ පුත්‍රයාණන්වහන්සේගේ ආත්මයාණන් ලෙස පැමිණියේ අපව මෙම දිව්‍ය ස්වාභාවයට පංගුකාරයන් කිරීමට, අපගේ හදවත් තුල දෙවියන් වහන්සේගේ ප්‍රේමය වැගිරවීමට, පුත්‍රයාණන්ගේ වාසය සහ උන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් තුල සුරක්ෂිතකිරීමට, ක්‍රිස්තුස් වහන්සේ සැබවින්ම අපතුල සෑදී ඇති තරමට අපගේ මුළු අභ්‍යන්තර මනුෂ්‍යයා උන්වහන්සේගේ ස්වාභාවයේ සහ උන්වහන්සේගේ සමානත්වයේ සළකුණු දරනු ඇත. අපව දිව්‍ය ස්වාභාවයට පංගුකාරයන් කිරීමට අපගේ හදවත් තුල දෙවියන් වහන්සේගේ ප්‍රේමය වැගිරවීමට, අපව ක්‍රිස්තුස් වහන්සේට සමාන කිරීමට මෙය මොනතරම් තේජාන්විත කාර්‍ය්‍යයක්ද?

ඔබගේ ජීවිතයේ එවැනි ක්‍රියාවකට ඔබ ආශාකරන්නේ නැද්ද? ඔබ තුල සිට ජීවමාන ජලගංගා ගලාඒමට ඔබ ආශාකරන්නේ නැද්ද? ඔබ තුලම ආත්මාර්ථකාමීත්යෙන් සහ පාපයෙන් ජයගෙන ජයග්‍රාහිකව ගමන්කිරීමට ඔබට අවශ්‍යද? අන්අයට සාක්ෂිදැරීමේදී ඔබට බලය සහ නිර්භීතකම අවශ්‍යද ? ප්‍රේමයෙන්, ප්‍රීතියෙන්, සමාදනයෙන් සහ අනෙකුත් ඵලවලින් පිරීසිටීමට ඔබට අවශ්‍යද? ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ මහිමය පිළිබඳ වඩාත් හෙළිදරව්වක් ඔබට අවශ්‍යද?

පිපාසය සහ යාච්ඤාකිරීම

ඔබ එවැනි දේ උදෙසා ආශාකරන්නේ නම්, ඔබ නිවැරදි මාර්ගයේය. මන්ද යේසුස් වහන්සේ මෙසේ වදාරණසේක. **"වංගල්‍යයේ මහත් දවසවූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිටසිට ශබ්ද පවත්වමින් යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ."** (යොහාන් 7: 37) පිපාසය ඇතිකරන වෙනස මූඩි මහතා අවධාරණය කරයි. වර්ථමානයේ සභාවේ බොහෝදෙනා අඳුරු කාන්තාරයක්මෙන්ය. සියල්ල වියළී, පාළුවටගොස් ඇති අතර පෙනෙන පරිදි ඔවුන් තුල ජීවයක් නැත. හරිත ලෝරිස් ගසක් (දවුල් කුරුඳු ගසක්) මෙන් ඵලදරණ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගෙන් පිරීසිටින මනුෂ්‍යයෙකු අසල වාඩිවී සිටියහැකි නමුත් ඔවුන් ඒ හා සමාන ආශිර්වාදයක් සොයන්නේ නැත. මේ වෙනස සිදුවන්නේ ඇයි? පිපාසයෙන් සිටින තැනැත්තාට දෙවියන් වහන්සේ වතුරවත්කළ නිසා ඒ වෙනස ඇතිවේ. එක් අයෙක් මෙම අභිෂේක කිරීම සොයමින් සිටි අතර ඔහුට එය ලැබීඇත. අනිත් සියල්ලටම වඩා අපට මෙය අවශ්‍යයවූ විට දෙවියන් වහන්සේ අපට එය ලබාදෙනසේක.

එබැවින් ආත්මයෙන් තෘප්තිමත්වීමට පිපාසය අත්‍යවශ්‍යයවේ. නිශ්චිතව යාච්ඤාකිරීම තුලින් ස්වාමීන්වහන්සේව සෙවීමත් එසේම අවශ්‍යයවේ. යේසුස් වහන්සේ තම ගෝලයන්ට දුන් උපදෙස් සලකාබලන්න. **"බලව, වම වාගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව නුඹළා වෙතට එවවි. නුවුත් ඉහළින් නුඹළා බලයෙන් සන්සනු ලබනතුර නුවර නැවතී සිටපල්ලායයි කීසේක."** (ලූක් 24: 49) ඔවුන් උන්වහන්සේගේ වචන සම්පූර්ණයෙන්ම සිතටගත් අතර උන්වහන්සේව ඔසවාගනු ලැබූපසු ඔවුන් යෙරුසලමේ උඩුමහල් කාමරයේ රැස්වෙමින්, **"වේ සියල්ලෝම ස්ත්‍රීන්ද, යේසුස් වහන්සේගේ මව්වූ මරියාද, උන්වහන්සේගේ සහෝදරයන්ද සමග එක්සිත්ව නොකඩවාම යාච්ඤාකරමින් සිටියෝය."** (ක්‍රියා 1: 14) පෙන්තකොස්ත දිනය පැමිණෙන තෙක් යාච්ඤාකළෝය. උන්වහන්සේ තම පොරොන්දුව අනුව තම ආත්මය ඔවුන් මත වැගිරෙවූ සේක. ඔවුන්ගේ ජීවිත දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන්, බලයෙන්, නිර්භීතකමෙන් පිරීගිය අතර සභාව ප්‍රබෝධමත් ආකාරයෙන් වර්ධනයවීමට පටන්ගත්තේය. ඔවුන් දිගටම යාච්ඤා කරනවිට (ක්‍රියා 2: 42, 4: 31) ස්වාමීන් වහන්සේ තම ආත්මය තුලින් ඔවුන්ව බලගැන්වීම දිගටම කරගෙන ගියසේක.

ස්වාමීන්වහන්සේ ඒ ආකාරයෙන්ම විශ්වාසවන්තව හා යාච්ඤාවට පිළිතුරු වශයෙන් උන්වහන්සේගේ ආත්මය අපකෙරෙහි වැගිරවීමට ආශාවෙන් සිටිනවා නොවේද? යේසුස් වහන්සේම අපට මෙසේ මතක්කර දෙනසේක. **"වමද නුඹළාට කියවි. ඉල්ලාපල්ලා, එවිට නුඹළාට දෙනුලැබේ. සොයාපල්ලා, එවිට නුඹළාට සම්බවේ. තට්ටුකරපල්ලා, එවිට නුඹළාට දොරහරිනු ලැබේ. වක්නිසාද ඉල්ලන සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටුකරන්නාට දොරහරිනු ලැබේ."** (ලූක් 11: 9-10) උන්වහන්සේ තවදුරටත් මෙසේ පැවසූසේක. **"මෙසේ නපුරුවූ නුඹලා නුඹළාගේ දරුවන්ට යහපත්දේ දෙන්ට දනිවු නම්, කොපවණ වැඩියෙන් නුඹළාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙනසේක්දැයි කීසේක."** (ලූක් 11: 13) අපගේ ජීවිතවල ශුද්ධාත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය සඳහා අපි දැඩි ලෙස යාච්ඤා කරමු.

අපි මහත් ඇදහිල්ලකින් යුතුව යාච්ඤා කරමු. අපි ශුද්ධාත්මයෙන් පිරීසිටීම ස්වාමීන්වහන්සේගේ කැමැත්ත බව අපි නිසැකවම දනිමු. **"වක්නිසාද ඒ පොරොන්දුව නුඹළාටත් නුඹළාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන් වහන්සේ යම් පමණදෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවනසේක්ද දුරසිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා, වෙනත් බොහෝ වචනවලින් සාක්ෂිදී..."** (ක්‍රියා 2: 39) **"වුදුකපානයෙන් මත් නොවෙල්ලා, එයින් අනාචාරකම් හටගන්නේය. නුවුත් ආත්මයා -ණන්ගෙන් පූර්ණවී..."** (එපීස 5: 18) එමනිසා අපට මහත් අපේක්ෂාවකින් යුතුව යාච්ඤා කළහැකිය. **"උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම්දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අපි දනිවු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූදේ අපට ලැබෙන බව දනිවුව."** (1 යොහාන් 5: 14-15)

පාපය සමග ගැඹුරු ලෙස කටයුතු කරන්න

ශුද්ධාත්මයාණන්ගේ පූර්ණත්වය සඳහා අපි ස්වාමීන්වහන්සේව සොයනවිට අපගේ ජීවිතයේ ඕනෑම පාපයක් සමග ගැඹුරෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍යයවේ. ආර්. ඒ. ටෝරි ඔහුගේ එක් පොතක බෙදගන්නා පරිදි, ශුද්ධාත්මයාණන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ වන අතර අපට උන්වහන්සේ සහ පාපය යන දෙකම තිබිය නොහැකිය. අපි ශුද්ධාත්මයාණන් වහන්සේ සහ අශුද්ධ පාපය අතරින් අපගේ තෝරාගැනීම කලයුතුය. අපට ඒ දෙකම තිබිය නොහැකිය. එක් පාපයක් හෝ පාප දෙකක් හෝ පාප තුනක් හෝ බොහෝ පාප අත්හැරීම ප්‍රමාණවත් නොවේ. අපි සියළු පාප අත්හැරිය යුතුය. අපි දන්නාවූ එකම පාපයකට ඇලීසිටියොත් එය අපගේ ආශිර්වාදයන් වසාදමනු ඇත. යම් කෙනෙක් ශුද්ධාත්මයෙන් බෞතීස්මවීමට අවංකවම කැමතිනම්, ඔහු දෙවියන් වහන්සේ සමග තනිවම ගොස් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිය යුත්තේ තමාව සෝදිසිකර බලා හදවතේ හෝ ජීවිතයේ උන්වහන්සේව වේදනාවට පත්කරන යම් නපුරු දෙයක් ඇත්නම් එය ආලෝකයට ගෙනඑන ලෙසයි. උන්වහන්සේ එය ආලෝකයට ගෙනඑන විට එය ඉවත දැමියයුතුය.

කීකරුකම සහ යටත්වීම

ආත්මයෙන් පිරුණු ජීවිතයේ ආශිර්වාදයට ඇතුළුවීමට තවත් යතුරු දෙකක් වන්නේ කීකරුකම සහ දෙවියන්වහන්සේට සම්පූර්ණයෙන්ම යටත්වීමයි. ක්‍රියා 5: 32 වන පදයට අනුව ස්වාමීන්වහන්සේ තමන්වහන්සේට කීකරුවෙන අයට ශුද්ධාත්මයාණන් වහන්සේව ලබාදෙනසේක. නැවතත් ටෝරිගේ වැදගත් වචනයක් තිබේ. "කීකරුකම හදවතේ කැමැත්ත තුල ඇත. කීකරුකමේ සාරය දෙවියන් වහන්සේට කැමැත්ත භාරදීමයි. එය අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ වෙත ගොස් මෙසේ කියයි. "ස්වර්ගීය පියාණෙනි, මෙන්න මම ඔබවහන්සේට අයිතිව සිටිමි. ඔබවහන්සේ මාව මිලදීගෙන ඇත. මම ඔබගේ අයිතිය පිළිගනිමි. මා සහ මට අයිති සියල්ල ඔබවහන්සේට සම්පූර්ණයෙන්ම භාරදෙමි. ඔබ කැමති තැනකට මාව යැවුව මැනව. ඔබ කැමති දේ මා සමග කළමැනව. ඔබවහන්සේ කැමති පරිදි මාව පාවිච්චි කළමැනව." බොහෝ අවස්ථාවලදී ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් බෞතීස්මය ලැබීමේදී තීරණාත්මක පියවර මෙයයි. මගේ සියල්ල පූජාසනය මතයි කියා මට සැබවින්ම පැවසීය හැකිවිට අපට ගින්න එනතුරු වැඩිවෙලාවක් බලා සිටීමට සිදුනොවනු ඇත. මෙම සම්පූර්ණ යටත්වීම නොමැතිකම අද බොහෝ දෙනෙකුව ආශිර්වාදයෙන් ඈත්කරදමා ඇත. මනුෂ්‍යයන් තම හදවතේ සෑම රහස් කාමරයකම යතුරු දෙවියන් වහන්සේට භාරදෙයි. නමුත් තමන් විසින්ම යතුරු තබාගැනීමට කැමති කුඩාරහස් කාමරයක් තබාගෙන තිබේ. එවිට ආශිර්වාදය ලැබෙන්නේ නැත.

ඇදහිල්ලෙන් යේසුස් වහනසේ දෙස බලන්න

යේසුස් වහන්සේ අපට ආරාධනා කරන්නේ උන්වහන්සේ වෙතට පැමිණ මෙම වටිනා දීමනාව සඳහා උන්හවන්සේ කෙරෙහි ඇදහිල්ලතබන ලෙසවේ. **"වංගල්‍යයේ මහත් දවසවූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වමින් යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ. මා කෙරෙහි අදහන්නා තුමුන් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක."** (යොහාන් 7: 37-38) **"එබැවින් නුඹළාට කියවි, නුඹළා යාච්ඤාකොට ඉල්ලන මොනදෙයක් වුවත් ඒ සියල්ල නුඹළාට ලැබුණේයයි අදහාපල්ලා,එවා නුඹළාට ලැබෙන්නේය."** (මාර්ක් 11: 24) යනුවෙන්ද උන්වහන්සේ පොරොන්දුවී තිබෙනසේක.

උන්වහන්සේට සහ උන්වහන්සේගේ අරමුණුවලට සම්පූර්ණයෙන්ම යටත්වීමටත්, ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාකිරීමට බාදකරන ඕනෑම දෙයක් ඉවත්කර දැමීමට ජීවමාන ජලගංගා වලින් අපව පුරවන ලෙස උනන්දුවෙන් සහ අපේක්ෂාවෙන් යුතුව යාච්ඤාකිරීමටත් කාලය මෙය නොවේද? "ස්වාමීනී, ඔබවහන්සේගේ මහිමය සඳහා සම්පූර්ණයෙන්ම ජීවත්වීමටත්, අප අවට සිටින අය සමග ඔබගේ ප්‍රේමය හා ජීවිතය බෙදගැනීමටත්, ඔබගේ ආත්මයෙන් පිරී ඉතිරියාමට අපව පුරවන්න."

"මක්නිසාද පිපාසා ඇත්තා කෙරෙහි වතුරද වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරුවන්නෙමි." (යෙසායා 44: 3)

පිරී ඉතිරියන්න

"...මා කෙරෙහි අදහන්නාට කිසිකලකත් පිපාසා නොවන්නේය." (යොහාන් 6: 35) **"මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක"** (යොහාන් 7: 38)

පෙන්තකොස්ත දිනයේ පූර්ණ ආශිර්වාදය තවත් වැඩිකළ හැකිද? පිරී ඇති ඕනෑම දෙයක් තවත් පිරීයා හැකිද? ඔව්, නිසැකවම උතුරායන තරමට පිරීයා හැකිය. මෙය විශේෂයෙන් පෙන්තකොස්ත දිනයේ ආශිර්වාදයේ ලක්ෂණ සහ නීතියයි.

ඉහතින් උපුටා දක්වා ඇති අපගේ ආශිර්වාදලත් ස්වාමීන් වන යේසුස් වහන්සේගේ වචන අපට ද්විත්ව ආශිර්වාදයක් පෙන්වා දෙයි. පළමුව යේසුස් වහන්සේ පවසන්නේ උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන තැනැත්තා කිසිවිටෙකත් පිපාසයෙන් නොසිටින බවයි. උන්වහන්සේ තුල ඔහු සෑමවිටම තමාගේ අවශ්‍යතා සපුරාලීමේ ජීවිතයක් ලබනු ඇත. ඉන්පසු යේසුස් වහන්සේ වඩාත් ශ්‍රේෂ්ඨ හා තේජාන්විත දෙයක් ගැන කථාකරයි. උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන තැනැත්තා තුලින් අන් අයගේ පිපාසය සන්සිඳවා ගැනීම සඳහා ඔහුගේ හදවතින් ජීවමාන ජලය ඇති ගංගා ගලා ඒමයි. එය පූර්ණවීම සහ පිරී ඉතිරියාම අතර වෙනසයි.

භාජනයක් පිරී තිබිය හැකි නමුත් අන් අයට එයින් කිසිවක් නොතිබිය හැකිය. එය දිගටම පිරී ඇතිවිට සහ අන් අයට යමක් ඉතිරිව ඇතිවිට එහි අධික ලෙස ගලායන සැපයුමක් තිබිය යුතුය. අපගේ ස්වාමීන්වහන්සේ තම ඇදහිල්වන්ත ගෝලයන්ට පොරොන්දු වන්නේ මෙයයි. ආරම්භයේදීම උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඔවුන්ට කිසිදු පිපාසයෙන් නොසිටීමට ආශිර්වාදය ලබාදෙයි. නමුත් ඔවුන් ඉදිරියටගොස් ඇදහිල්ලෙන් ශක්තිමත් වනවිට එය ඔවුන්ව ජල උල්පතක් බවට පත්කරනු ලබයි. එයින් ගංගා අන් අය වෙතට ගලායයි. මුලින් අපව පුරවන ආත්මයාණන් වහන්සේ අපතුලින් අපවටා සිටින අයගේ ආත්ම වෙතට ජීවන ජලය උතුරා ගලායන්නට සලස්වනසේක.

ජීවමාන ජලය ඇති ගංගා සම්බන්ධයෙන් එය පෘතුවියේ බෙහෝ උල්පත් සමග සමානවේ. අපි ඒවා විවෘතකිරීමට පටන්ගන්නා විට ඇළ දුර්වලවේ. ජලය වැඩි වැඩියෙන් පාවිච්චි කරන තරමට ජලය වඩාත් ප්‍රබල ලෙස ගලායයි. මෙම මූල -ධර්මය අධ්‍යාත්මික ජීවිතය තුල කොයිතරම් දුරට වලංගුදැයි විමසීමට සහ අතීතයේ පූර්ණත්වය අපෙන් නිරන්තරයෙන් බහුල ලෙස ගලා ඒමට හැකිබව සහතික කිරීමට අවශ්‍යය දේ සොයාගැනීමට මම කැමැත්තෙමි. මෙම දැණුම ලබාගැනීමට අපට උපකාර කළහැකි සරල උපදෙස් කිහිපයක් තිබේ.

ඔබ සතුව ඇතිදේ තදින් අල්ලාගන්න

දෙවියන් වහන්සේ ඔබටදී ඇති ආශිර්වාදය වරදවා වටහා නොගැනීමට වගබලාගන්න. සම්පූර්ණ ආශිර්වාදය කුමක්ද යන්න පිළිබඳව ඔබට ඔබට වැරදි ආකල්ප ඇතිනොවීමට වගබලාගන්න. පෙන්තකොස්ත දිනයේ සජීවීකරණය ප්‍රීතිය සහ බලය වහාම දැනියයුතු බවත්, දැකියයුතු බවත් නොසිතන්න. ඔබ දෙවියන් වහන්සේට පරිපූර්ණ හදවතකින් ඔබව ලබාදී ඇති බව ඔබදන්නේ නම්, සහ දෙවියන් වහන්සේ සැබවින්ම සහ උන්වහන්සේගේ මුළු දිව්‍ය බලයෙන් ඔබ තුල උන්වහන්සේගේ පොරොන්දුව ඉටුකිරීමට බලාසිටින බව ඔබ දන්නේ නම්, උන්වහන්සේගේ මුහුණ ඉදිරියෙහි නිශ්ශබ්දව රැඳී සිට ඔබේ අඛණ්ඩතාවය තදින් අල්ලාගන්න. ශීතඍතුවේ සීතල, සියල්ල මරණයෙන් වළලනු ලබනවා දුටුවත් හබක්කුක් අනාගතවකතෘ සමග මෙසේ කියන්න. **"එක්නිසාද අතනික්කා ගස දළු නොලැවත්, මුදිකවැල්වල පලදුවක් නොනිබුණත්, ඵලීවගසේ ඵල හටනොගත්තත්, කෙත්වලින් භෝජන නොලැබුණත්,ගාලෙන් එළු බැටළු රළු සිඳදවනු ලැබුවත්, පට්ටිවල ගවයන් නැතුව ගියත්, මම වනාහී ස්වාමීන්වහන්සේ කෙරෙහි සන්තෝෂ වන්නෙමි. මාගේ ගැළවීමේ දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රීතිවන්වන්නෙමි."** (හබක්කුක් 3: 17-18) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් සහ උන්වහන්සේට ඔබේ සම්පූර්ණ යටත්වීමෙන් පවිත්‍ර භාජනයක් ලෙස ඔබව පුරවාගැනීමට නම්, දෙවියන් වහන්සේ ඔබව පිළිගෙන ඇතිබව ඔබ විශ්වාස කරමින් දිනෙන් දින මෙම ආකල්පයේ රැඳිසිටින්න. එම විශ්වාසය කරුණුකොටගෙන ආශිර්වාදය වර්ධනයවී ගලාඒමට පටන්ගන්නවා ඇත. **"ඉන්නිසා බලව, නෝඵාගත්, අනර්ඝ, කොනේ ප්‍රධාන ගලක් සියොන්හී තබමි. උන්වහන්සේ කෙරෙහි අදහගන්නා ලැජ්ජාවට නොපැවිණෙන්නේයයි ලියවිල්ලේ අන්තර්ගතව තිබේ."** (1 ප්‍රේතුස් 2: 6)

ප්‍රතික්ෂේප කිරීම සහ කැපවීම තුල නොපසුබටව උත්සහ දරන්න

මට ජලාශයක් අවශ්‍යය නම්, ඒ සඳහා මම කරන කැනීම් ප්‍රමාණය වැඩිවන තරමට, එහි ඉඩප්‍රමාණය වැඩිවන තරමට, මට රැස්කරගතහැකි ජලප්‍රමාණය වැඩි වන අතර සොරොව්ව විවෘත කරනවිට එයින් ගලායන දියපහර ශක්තිමත්වේ. ශුද්ධකම සඳහා හෝ ආත්මයාණන්ගෙන් පූර්ණ ආශිර්වාදය සඳහා ඔබේ යටත්වීමේදී ස්වර්ග රාජ්‍යයේ මෙම මුතු ඇටය දිනාගැනීම සඳහා ඔබ සියල්ල කැපකිරීමට සහ අත්හැරීමට සූදනම් බව සැබවින්ම සහ අවංකව පවසා තිබෙනවිට මෙම කැපවීම දෙවියන් වහන්සේට පිළිගත හැකිවේ.

නුමුත් ඔබ එය ප්‍රකාශ කිරීමේදී පාවිච්චිකල වචනවලින් අදහස් කළදේ සම්පූර්ණයෙන් තවමත් අවබෝධ කරගෙන නැත. එක් පුද්ගලයෙකුගේ ආත්මය පිළිබඳව සැලකිල්ල දක්වන්නේ කෙසේදැයි ස්වාමීන්වහන්සේ උගන්වා තිබෙනසේක. ඔබගේ ස්වාභාවය කොයිතරම් ගැඹුරින් මුල්බැස තිබේද ? එය කොයිතරම් දූෂ්‍යයවී තිබේද යන්න පිළිබඳව ඔබට ඉගැන්වීමට ස්වාමීන්වහන්සේට තවත් බොහෝදේ තිබෙනසේක. ඔබ කියන සහ කරන දේවල රහස් මූලාශ්‍රය ලෙස ඔබගේම ජීවිතය නිරන්තරයෙන්ම සහ සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමෙන් ආත්මයාණන් වහන්සේට ඉඩදීමට කැමැත්තෙන් සිටින්න. එවිට උන්වහන්සේ සෑමවිටම පැමිණ හිස්තැන පිරවීමට කැමැත්තෙන් සිටින බව ඔබට සහතික වියහැකිය.

ඔබ දන්නා පරිදි ඔබ සියල්ල අත්හැර සහ පූජාකර ඇත. නුමුත් ආත්මයාණන් වහන්සේගේ ඉගැන්වීමට ඔබගේ මනස විවෘතව තබාගන්න. එවිට උන්වහන්සේ ඔබව තවදුරටත් ඉදිරියට ගෙනයන අතර ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශයෙන් පසු සියල්ලේ සම්පූර්ණ පූජාවීම නැවත උන්වහන්සේගේ සභාවේ පාලනය බවට පත්වූ විට පමණක් සම්පූර්ණ ආශිර්වාදය නැවතත් උතුරායන දිය පහරක් මෙන් ගලා එන බව ඔබට පෙනෙනු ඇත. සමහරවිට ඉතා සුළුදෙයක් පවා ආශිර්වාදය වර්ධනය කිරීමට බාදවක් වියහැකි ආකාරය පුදුම සහගතය. උදාහරණයක් වශයෙන් එය මිතුරන් අතර ඇතිවන සුළු මතභේදතාවයක් විය හැකිය. එහිදී ඔවුන් ක්‍රිස්තුස් වහන්සේගේ නීතියට අනුව එකවර සමාවදීමට සහ ඉවසා සිටීමට කැමති නැති බව පෙන්වයි. නැතහොත් එය අවශ්‍යය සංවේදීතාවයකට හෝ පහත්ම ස්ථානයට යාමට සූදනම් නැති ස්වාභාවය නිරීක්ෂණයකින් තොරව සිටීම වියහැකිය.

නැතහොත් එය භූමික දේපල අපගේම දෙයක් ලෙස සන්තකයේ තබාගැනීම හෝ භාවිතාකිරීම වියහැකිය. නැතහොත් ක්‍රිස්තුස් වහන්සේ සෑමදිනකම අපගේ අත්වලින් අපේක්ෂා කරන තමාවම ප්‍රතික්ෂේප කිරීමකින් තොරව ආහාර ගැනීමේ, පානයකිරීමේ සතුටෙන් මාංශයට යම් සැපයුමක් වියහැකිය. නැතහොත් එය සාධාරණ (නීත්‍යානුකූල) හෝ අහිංසක දේවල් සම්බන්ධයෙන්

(ඇන්ඩ්‍රෘ මරේ විසිනි) (1828-1917)

වියහැකිය. කෙසේවෙතත් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවනු ලැබීමේ අපගේ කාර්‍යයට ඒවා නොගැලපේ. මක්නිසාද ස්වාමීවූ යේසුස් වහන්සේ තම දුෂ්කරතාවයන් වලදී ක්‍රියාකලාක්මෙන් අප සතුව ඇති ස්වර්ගීය කොටස අපගේ සියළුම ආශාවන් තෘප්තිමත් කිරීමට ප්‍රමාණවත් බව පෙන්වීමට අපි බැඳී සිටින්නෙමු. නැතහොත් එය මාංශයේ ආශාවට ඉඩදෙන සැකසහිත දේවල් සම්බන්ධයෙන් විය හැකිය.

ආත්මයාණන් වහන්සේගේ ආශිර්වාදයේ සම්පූර්ණ ප්‍රමාණය භුක්තිවිඳීමට ඔබ කැමතිද? එසේනම් පරීක්ෂාව පැමිණීමට පෙර යේසුස් වහන්සේව අණුකරණය කිරීමේ සහ සැබෑ ගෝලයෙකුවීමේ මූලික නීතිය තේරුම්ගැනීමට ඔබව පුහුණු කරගන්න. එනම්, **" සියල්ල අත්හරින්න."** මේ ජීවිතයේ සියගුණයක් යන ස්ථිර පොරොන්දුව මගින් ශක්තිමත්වීමට සහ එය පිළිපැදීමට ඔබවම ඇදගැනීමට ඉඩදෙන්න. ඔබට සම්පූර්ණ ආශිර්වාදයක් ලබාදෙනු ඇත. එය උතුරා ගලායන ප්‍රමාණයෙන් ලබාදෙනසේක.

දෙවියන් වහන්සේ ප්‍රේමයයි. උන්වහන්සේගේ මුළු පැවැත්මම ප්‍රේමයෙන් පිරිසිටීම මිස අන්කිසිවක් නොවේ. මක්නිසාද මැවිල්ල උන්වහන්සේගේ ශුද්ධකමට සහ ආදරයේ සහභාගීකමට ගෙන එන පිණිස උන්වහන්සේ ජීවත්වන සියල්ලට ආශිර්වාදකර ඔවුන්ගේ අවශ්‍යයතාවයන් සම්පූර්ණකරනසේක. දෙවියන් වහන්සේ ලෙස උන්වහන්සේගේ මහිමය නම්, උන්වහන්සේ තමන්සතු සියල්ල උන්වහන්සේගේම අභිමතය පරිදි තම මැවිල්ලට ලබාදීමයි.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ පුත්‍රයාය. උන්වහන්සේ, දෙවියන් වහන්සේගේ ප්‍රේමය දරන්නා, ගෙනඑන්නා සහ බෙදහරින්නා වනසේක. දෙවියන් වහන්සේ ස්වර්ගයේ අදෘශමානව සිටින අතර යේසුස් වහන්සේ පොළොවේ දෘෂමානවූසේක. උන්වහන්සේ පැමිණියේ, ජීවත්වූයේ, දුක්වින්දේ සහ මියගියේ පියාණන් වහන්සේව මහිමයට පත්කිරීමට පමණි. එනම්, පියාණන් වහන්සේ තම ප්‍රේමය කොයිතරම් තේජාන්විතද යන්න පෙන්වමින් ඕනෑම ජීවියෙකුට ඉහළම ගෞරවය පිරිනැමීමට ආශිර්වාදයදීමට පූජාවූබව ප්‍රකාශකිරීමට වූසේක.

පියාණන් වහන්සේගේ සහ පුත්‍රයාණන් වහන්සේගේ ආත්මයාණන් ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණියේ අපව මෙම දිව්‍ය ස්වාභාවයේ කොටස්කරුවන් බවට පත්කිරීමටත්, අපගේ හදවත් තුල දෙවියන් වහන්සේගේ ප්‍රේමය වැගිරවීමටත්, පුත්‍රයාණන් වහන්සේගේ වාසයකිරීම සහ උන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් තුල සුරක්ෂිත කිරීමටත්, ක්‍රිස්තුස් වහන්සේ සැබවින්ම අප තුල නිර්මාණයවීමටත්, අපගේ මුළු **"අභ්‍යන්තර විනිසා"** උන්වහන්සේගේ ස්වාභාවයේ සහ උන්වහන්සේගේ සමානත්වයේ සළකුණු දරාසිටීමටත්ය.

එබැවින් මින්ඉදිරියට ආත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය සොයනවිට, ලබාගන්නවිට සහ එය වර්ධනය කරගන්න ආශාකරනවිට ඔහුට මෙම ප්‍රේමයේ ආශිර්වාදය භුක්තිවිඳිය හැකිවන්නේ ප්‍රේමයේ සේවය තුල පවතින්නාවූ ජීවිතයකට තමාව කැපකිරීමට සූදනම්වූ විට පමණක් බව පරිපූර්ණ ලෙස පැහැදිලි නොවේද? ආත්මයාණන් වහන්සේ පැමිණෙන්නේ ආත්මාර්ථකාමී ජීවිතය සහ ආත්මාර්ථ කාමීත්වය දුරුකිරීමටයි. එක් පැත්තකින් බැලූවිට ආත්මයානන් වහන්සේගේ පූර්ණත්වය යනු අන් අයගේ ආශිර්වාදයට සහ සියල්ලන්ගේම සේවකයන් ලෙස තමාව කැපකිරීමට ඇති කැමැත්ත

6 පිටුවට

5 පිටුවෙන්

පිරී ඉතිරියන්න...

පූර්ව නිගමනය කිරීමයි. එය නිරන්තරයෙන් වර්ධනය වන සහ සීමාරහිත ප්‍රමාණයකින් පැවතිය යුතුය. ආත්මයාණන් වහන්සේ යනු දෙවියන් වහන්සේව පිටතට ගලායාමයි. අපි උන්වහන්සේට යටහත් වුවහොත් උන්වහනසේ අපේ හදවතේ ගැඹුරින් ගලායන ජීවමාන ගංගාව බවට කරනු ඇත.

ඔබට ආශිර්වාද වැඩිකර ගැනීමට අවශ්‍යය නම්, දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඔබතුල ක්‍රියාත්මක වන පරිදි පමණක් පොළොවේ ඉතිරිවූ පුද්ගලයෙකු ලෙස ජීවත්වීමට පටන්ගන්න. ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන ඔබ තුල ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් ඔබවටා සිටින සියල්ලන්ට ප්‍රේමකරන්න. දෙවියන් වහන්සේගේ දරුවන්ට, දුර්වලඅයට, විශේෂයෙන් විරුද්ධවාදීන්ට වුවත් සුභදශීලිව ප්‍රේමකරන්න. හැකි සෑම ආකාරයකින්ම ඔබගේ ප්‍රේමය ක්‍රියාත්මක කර පෙන්වන්න. ගැළවීම නොලැබුවාවූ අයටත් ප්‍රේමය දක්වන්න.

ආත්මයානන් වහන්සේට ප්‍රේමකිරීම සඳහා ඔබගේ ජීවිතයේ ඉඩහරින්න. එවිට ප්‍රේමය ඔබව කථාකිරීමට, වැඩකිරීමට, දීමට සහ යාච්ඤාකිරීමට පොළඹවනු ඇත. වැඩකිරීමට විවෘතවූ දොරක් නැතිනම්, නැතහොත් ඔබට ඒ සඳහා ශක්තිය නොමැතිනම්, යාච්ඤාවේ දොරටුව සෑමවිටම විවෘතව පවතින අතර කරුණාසනය ඉදිරියේදී බලය ලබාගත හැකිය. දෙවියන් වහන්සේ, යේසුස් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ, මෙන් අනිත් අයට ආශිර්වාදකිරීම සඳහා සම්පූර්ණයෙන්ම ජීවත් වෙන්න. එවිට ආශිර්වාදය ගලාගොස් පිරිඉතිරී යනු ඇත.

යේසුස් වහන්සේ සියල්ල වනසේක.

ශුද්ධ ලියවිල්ලේ මෙසේ පවසන්නේය. **“උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටිනසේක. සියල්ලද උන්වහන්සේ තුළ පවතින්නේය. උන්වහන්සේ සහාව නැවති ශරීරයට හිසට සිටිනසේක. උන්වහන්සේ පටන්ගැන්වව මළවුන්ගෙන් කැළඳුලාව සිටිනසේක. එසේව සිටින්නේ උන්වහන්සේ සියල්ලට ප්‍රධානව සිටින පිණිසය.”** (කොලොස්සි 1: 17-18) **“මක්නිසාද දෙවියන් වහන්සේගේ පොරොන්දු කොපමණ වුනත් උන්වහන්සේ තුළ එසේය කියාවේ. එහෙයින් අප කරුණුකොටගෙන දෙවියන් වහන්සේට ගෞරවය පැවිසෙන පිණිස උන්වහන්සේ කරුණාකොටගෙන ආවේන් කියාත්වේ.”** (2 කොරින්ති 1: 20) ස්වාමීන්වහන්සේ ජීවමාන ජලය ඇති ගංගා ගැන කථාකළවිට, උන්වහන්සේ පොරොන්දුව තමන් කෙරෙහි ඇදහිල්ල සමග සම්බන්ධ කළසේක. මා කෙරෙහි විශ්වාස කරන තැනැත්තා කෙරෙන් ජීවනදයක ජලයඇති ගංගා ගලන්නේය. **“විශ්වාසකරන්නා”** යන වචනය අපි නිවැරදිව තේරුම්ගත්තානම් ආශිර්වාදය වර්ධනය කළහැක්කේ කෙසේද යන ප්‍රශ්නයට මෙය හැර වෙනත් පිළිතුරක් අපට අවශ්‍යය නොවිය යුතුය.

ඇදහිල්ල යනු මූලික වශයෙන්, යේසුස් වහන්සේ දිව්‍ය ප්‍රේමය ගලායන උල්පතක් බවත්, මෙම ප්‍රේමය ගෙනඑන තැනැත්වහන්සේ බවත්, ප්‍රේමය ගලායන ජීවිතය දරාසිටින්නා ලෙස ආත්මයාණන් වහන්සේ සෑමවිටම උන්වහන්සේ වෙතින් ගලායන බවත් දැකීමයි. ඉන්පසු එම පොරොන්දුව වැළඳගැනීම, ක්‍රිස්තුස් වහන්සේ තුල සපයා ඇති පරිදි ආශිර්වාදය අත්පත්කරගැනිම, එහි නිශ්චිතභාවය තුල රැඳිසිටීම සහ දෙවියන් වහන්සේ තවමත් කිරීමට ඇතිදේ ගැන උන්වහන්සේට ස්තුතිකිරීමයි. ඉන්පසුව ඇදහිල්ල යනු ආත්මය විවෘතව තබාගැනීමක් වන අතර එමගින් ක්‍රිස්තුස් වහන්සේට ආශිර්වාදය සමග පැමිණ සියල්ල අත්පත්කර ගැනීමට සහ පිරවීමට හැකිවේ. ඒ අනුව ඇදහිල්ල කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ ආත්මය තුල උන්වහන්සේගේ ස්ථානය ලබාගන්නා අතර හදවතේ සිංහාසනයේ සිංහාසනාරූඩ වන ක්‍රිස්තුස් වහන්සේ වඩාත් උද්යෝගීමත් සහ නොබිඳුණු සම්බන්ධතාවය ඇතිව ඵලදයි ආශිර්වාදය බවට පත්වේ. ඔබ විශ්වාස කරන්නේ නම් දෙවියන් වහන්සේගේ මහිමය දකිනු ඇත යන පාඩම ඉගෙනගන්න. සෑම සැකයකදීම, දුර්වලකමකදීම, සෑම පරීක්ෂාවකදීම, ඔබ විශ්වාස කරනවා සොයා ගැනීමටත්, යේසුස් වහන්සේ කෙරෙහි ප්‍රීතිවීමටත්, ගණන්ගැනීමටත් ඔබතුල ඉඩහරින්න.

ඇදහිලිවන්තයෙකුට පාපයට මුහුණදිය හැකි සහ ඒවාට එරෙහිව සටන් කළහැකි ක්‍රමදෙකක් තිබේ. වචනයෙන් සහ යාච්ඤාවෙන් උන්වහන්සේගේ ශක්තිය සොයමින් උන්වහන්සේගේ මුළු ශක්තියෙන් පාපය වළක්වා ගැනීමට උත්සහකිරීමයි. මෙම ගැටුමේ ස්වරූපය වන්නේ අපි තම කැමැත්තෙහි බලය භාවිතා කිරීමයි. සටන් කළහැකි අනිත් ක්‍රමය නම්, පරීක්ෂාව ඇති මොහොතේදීම නිහඬව ඇදහිල්ල භාවිතා කරමින්, ස්වාමීන් වන යේසුස් වහන්සේ වෙතට හැරෙමින් මෙසේ පැවසීමයි. **“ස්වාමීන්වහන්සේ නුඹ ආරක්ෂාකරන තැනැත්වහන්සේය. ස්වාමීන්වහන්සේ දකුණතින් නුඹට සෙවණය.”** (ගීතාවලිය 121: 5) මෙය ඇදහිල්ලේ ක්‍රමයයි. **“මක්නිසාද දෙවියන් වහන්සේගෙන් උපන් යවක් ඇද්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය.”** (1යොහාන් 5: 4)

ඔව්, මෙය සැබවින්ම අවශ්‍යය එකම දෙයයි. මක්නිසාද යේසුස් වහන්සේට අපතුල උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය පවත්වා ගතහැකි එකම මාර්ගය එයයි. නොනවත්වා ඇදහිල්ල ක්‍රියාත්මක කිරීමෙන් ආශිර්වාදය නොනවත්වා ගලාඑනු ඇත. ක්‍රිස්තුස් වහන්සේ සෑම මොහොතකම අපට සියල්ල වියයුතුය. නැවුම් වාතය ආශ්වාස කිරීමෙන් එම ජීවිතය සෑම මොහොතකම අළුත් නොවන්නේ නම් මට පෙළොවේ ජීවිතයක් තිබීමෙන් කිසිඳු ප්‍රයෝජනයක් නැත. එසේවුවද දෙවියන් වහන්සේ සෑම මොහොතකම මා තුල දිව්‍ය ජීවිතය අළුත්කර, ආරක්ෂාකර ශක්තිමත් කළයුතුය. ක්‍රිස්තුස් වහන්සේ සමග මගේ එක්සත්කම කරුණුකොටගෙන උන්වහන්සේ මා වෙනුවෙන් මෙය කරනු ලබනසේක. ක්‍රිස්තුස් වහන්සේ හුදෙක් දෙවියන් වහන්සේගේ පූර්ණත්වය, දෙවියන් වහන්සේගේ ජීවිතය අප වෙනුවෙන් සූදානම්කර අපට සන්නිවේදනය කරන දෙවියන් වහන්සේගේ ප්‍රේමයයි. ආත්මයාණන් වහන්සේ යනු ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය, ජීවිතය, ප්‍රේමය අපතුල සහ අපවටා සන්නිවේදනය ඇතිකරන තැනැත්වහන්සේය.

අපවටා සිටින ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ස්වර්ගීය බලයෙන් සිටින බවත්, උන්වහන්සේගේ ආත්මයේ ගංගා අපතුලින් ගලායාමට සැලැස්වීමට ආශාවෙන් සිටින බවත්, අපි විශ්වාස කරන්නෙමු. සර්වබලධාරී ස්වාමීන්වහන්සේ තම වචනය බලයෙන් ඉටුකරන බවත්, අපගේ එකම තෝරාගැනීම උන්වහන්සේව දැකීම, උන්වහන්සේ තුල ප්‍රීතිවීම, උනවහන්සේ වෙනුවෙන් සියල්ල කැපකිරීම බවත්, ප්‍රීතිමත් සහතිකයකින් පිරුණු හදවතක් ලබාගැනීමටත් උත්සහ කරමු. එවිට උන්වහන්සේගේ වචනය සැබෑ බව පෙනෙනු ඇත. **“මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදයක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක.”** (යොහාන් 7: 38) ආමේන්...!

සේවය සඳහා ආත්මයාණන් වහන්සේගේ බලය

යොහාන් 7: වන පරිච්ඡේදයේ ස්වාමීන් වන යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් ආත්මයාණන් ලබන තැනැත්තා ගැන පවසන බව ඔබට පෙනෙනු ඇත. **“මාකෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදයක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක.”** (යොහාන් 7: 38)

ළිඳක් හැරීමට ක්‍රම දෙකක් තිබේ. එංගලන්තයේ ගොවිපොළක පිරිමි ළමයෙක් ලෙස මා සිටින කාලයේදී පරණ ලී පොම්ප සහිත ළිඳක් තිබුණි. සේදීමේ දිනවලදී මට එම ළඳෙන් වතුර පොම්ප කිරීමට සහ ගවයන්ට වතුර දැමීමට සිදුවිය. බොහෝවිට මගේ අත වෙහෙසට පත්වනතුරු මට වතුර පොම්ප කිරීමට සිදුවිය. නමුත් දැන් ඔවුන්ට වඩා හොඳ ක්‍රමයක් තිබේ. ඔවුන් අඩිකිහිපයක් පහළට හාරා සිදුර ඉහළටගෙන පොම්පය දමන්නේ නැත. නමුත් ඔවුන් මැටි, වැලි සහ පර්වත හරහා පහළට ගොස් ඔවුන් පහළ ඇළ ලෙස හඳුන්වන දෙයට පහර දෙන තෙක් පහලට යයි. එවිට එයට **“ආටේෂියන් ”** යනුවෙන් හඳුන්වනු ලැබේ. මන්ද ජලය ස්වයංක්‍රීයව පහළ ගැඹුරේ සිට ඉහළට එන බැවින් ශ්‍රමය අවශ්‍යය නොවේ.

මම සිතන්නේ දෙවියන් වහන්සේට අවශ්‍යය වන්නේ උන්වහන්සේගේ සියළු දරුවන් පොම්පකිරීම නොව කෙලින්ම පිටතට ගලායාමයි. දේශනා කුඩුවේ සිටින දේවසේවකයන් නිතුරුවම පොම්ප කරමින් සිටිනවා ඔබ දැකනැද්ද? මටත් බොහෝ වාරයක් එසේකිරීමට සිදුවීඇත. එය කෙසේදැයි මම දනිමි. දේශනා කුඩුවේ සිටින දේවසේවකයන් නිරතුරුවම කථාකරමින් සිටින අතර මනුෂ්‍යයන් නිදිකිරා වැටෙමින් සිටිති. ඔවුන්ව අවදිකිරීමට නුපුළුවන. ප්‍රශ්නය කුමක්ද? ජීවමාන ජලය එහි නැත. ළිඳේ ජලය නොමැතිවිට ඔවුන් පොම්පකරමින් සිටියි. ඔබට වියළි ළිඳකින් ජලය ලබාගත නොහැකිය. ඔබ ළිඳෙන් යමක් ලබාගත යුතුය, නැතහොත් ඔබට කිසිවක් පිටතට ගතනොහැකිය.

දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අපමත රැඳිසිටින විට සේවය සඳහා අපව ආලේපකරනු ලබනසේක. එවිට අපට මහත්දේ කලහැකිය. දෙවියන් වහන්සේ මෙසේ පවසනසේක. **“මක්නිසාද පිපාසා ඇත්තා කෙරෙහි වතුරද, වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරුවන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද, නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි.”** (යෙසායා 44: 3) මෙය කොපමණ ආශිර්වාදලත් සිතුවිල්ලක්ද? **“ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශිර්වාදලද්දෝය; මක්නිසාද ඔවුන් තෘප්තියට පැවිසෙන්නෝය.”** (මතෙව් 5: 6)

(ඩී. එල්. මූඩි විසිනි)(1837- 1899)

ගලායන ජලධාරා

ජීවමාන ජලයෙන් පිරුණු අය දෙවියන් වහන්සේගේ කරුණාවේ සුභාරංචිය ප්‍රකාශකිරීමට යොමුවෙනවා දැකීමට මම කැමැත්තෙමි. මනුෂ්‍යයෙකු එලෙස පූර්ණවූ විට ඔහු තවදුරටත් දෙවියන් වහන්සේගේ සේවයට සූදානම්ය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් අපමත රැඳිසිටින විට ලෝකය, මාංශය සහ යක්ෂයා පරාජයකර ජයගතහැකි බලය අපට දැනෙනු ඇත. අපගේ කෝපය, උඩඟුකම සහ අනෙකුත් සියළුම නපුරු දේවලින් ජයගැනීමට හැකි බලය අප සතුව ඇත. එමෙන්ම මෙම පාප අපගේ

7 පිටුවට

“...,එහෙත් ඒ පැයේදී නුඹළාට යමක් දෙනුලැබේද ඒක කියාපල්ලා මක්නිසාද කථාකරන්නේ නුඹළා නොව ශුද්ධාත්මයාණන් වහන්සේය.”(මාර්ක් 13: 11)

6 පිටුවෙන්

සේවය සඳහා ආත්මයාණන්...

දෙපායට දමා පාගා ගතහැකිවූවිට මනුෂ්‍යයන් අප වෙතට පැමිණ මෙසේ පවසනු ඇත. **"ඔබට මේ බලය ලැබුණේ කෙසේද? මටත් මේ බලය ලබා ගැනීමට අවශ්‍යයයි. මට නැති දෙයක් ඔබ සතුව ඇත. මටත් එය අවශ්‍යයව තිබේ."**

දෙවියන් වහන්සේ අපට මේ සත්‍යය පෙන්වාදෙන සේක. අපි මුළු රාත්‍රියම වෙහෙසවී වැඩකළාද? අපි දකුණු පැත්තට දැල දමමු. අපගේ පව්වලට සමාව දෙනලෙසත්, ඉහළසිට පැමිණෙන බලයෙන් අපව අභිෂේක කරනලෙසත් අපි දෙවියන් වහන්සේගෙන් ඉල්ලාසිටිමු. නමුත් දෙවියන් වහන්සේ මෙම බලය නොඉවසිලිවන්ත මනුෂ්‍යයෙකුට හෝ ආත්මාර්ථකාමී ඉලක්ක ඇති මනුෂ්‍යයෙකුට ලබානොදෙන බව මතකතබා ගන්න. එවැනි මනුෂ්‍යයන් උඩගුකමෙන්, සියළු ලෞකික සිතුවිලි වලින් පිරීසිටින තෙක් උන්වහන්සේ එය ලබානොදෙනසේක. මන්ද අප සෙවිය යුත්තේ දෙවියන් වහන්සේගේ මහිමය මිස අපගේ මහිමයක් නොවේ. අපි මෙම තත්වයට (කාරණයට) පැමිණෙනවිට දෙවියන් වහන්සේ අපට යහපත සඳහා කොයිතරම් ඉක්මනින් ආශිර්වාද කරයිද? එවිට අපගේ ආශිර්වාදයේ ප්‍රමාණය පිරියනු ඇත.

ස්වර්ගයේ මිණුම කුමක්දැයි ඔබ දන්නවාද? **" දීපල්ලා, එවිට නුඹළාටත් දෙනු ලබන්නේය; ඩවූහු ඩබවින් සොලවවින් උතුරුවවින් නුඹළාගේ ඩඩොක්කුවලට හෙඳුකාර වැනදෙන්නෝය. වක්නිසාද නුඹළා යවි මිවිවකින් වැනදෙන්නහුද එයින්ම නැවත නුඹළාටත් වැනදෙනු ලැබෙන්නේයයි කීසේක."** (ලූක් 6: 38) අපි දෙවියන් වහන්සේගේ වචනයෙන් අපගේ හදවත් පුරවාගන්නේ නම් සාතන් ඊට ඇතුල්වන්නේ කෙසේද? ලෝකය ඊට ඇතුල්වන්නේ කෙසේද? ස්වර්ගයේ මිණුම හොඳ මිණුමකි. සම්පූර්ණ මිණුමකි. උතුරා පිටාර ගලායන මිණුමකි. ඔබට මෙම පූර්ණත්වය තිබෙනවාද? ඔබ සතුව එය නොමැති නම් එය සොයන්න. දෙවියන්වහන්සේගේ කරුණාවෙන් ඔබට එය ලැබෙනු ඇතැයි පවසන්න. මක්නිසාද මේ දේවල් අපට ලබාදීම දෙවියන් වහන්සේගේ සතුටයි. (ලූක් 12: 32)

උන්වහන්සේට අවශ්‍යය වන්නේ අපි මේ ලෝකයේ බැබළෙනවා දැකීමටයි. උන්වහන්සේගේ කාර්‍යය සඳහා අපව ඔසවාතැබීමයි. උන්වහන්සේගේ පුත්‍රයා වෙනුවෙන් සාක්ෂි දැරීමට අපට බලය ලැබීම උන්වහන්සේට අවශ්‍යය වන සේක. උන්වහන්සේගේ පුත්‍රයා වෙනුවෙන් සාක්ෂිදැරීමට අපව මේ ලෝකයේ තබා තිබෙනසේක. උන්වහන්සේ අපව මෙහි තබා ඇත්තේ මිලදීගැනීමට, විකිණීමට හෝ ලබාගැනීමට නොව ක්‍රිස්තුස් වහන්සේව මහිමයට පත්කිරීමටයි. ආත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය නැතිව ඔබ එය කරන්නේ කෙසේද? ප්‍රශ්ණය එයයි. දෙවියන් වහන්සේගේ බලය නොමැතිව ඔබ එය කරන්නේ කෙසේද?

ක්‍රිස්තුස් වහන්සේ මෙසේ පැවසූසේක, **"නුඹුත් ශුද්ධත්වයාණන් වහන්සේ නුඹළා කෙරෙහි පැවිණි කල නුඹළා බලය ලබන්නහුය. එවිට නුඹළා යෙරුසලමෙ -හිද, වුළු යුදයෙහිද, සමාරියෙහිද, පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක."**(ක්‍රියා 1: 8) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මහිමයට පත්වී දින දහයකට පසු පෙන්තකොස්ත දිනයේදී ශුද්ධාත්මයාණන් වහන්සේ බලයෙන් යුක්තව බැස ආසේක. සමහරු දැන් දෙවියන් වහන්සේගේ බලය ලබාගැනීමේ හැකියාව පිළිබඳව ප්‍රශ්ණ කරති. ඔවුන් සිතන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ඉන්පසු කිසිම දිනෙක ඒ හා සමාන ප්‍රකාශවීමකින් නොපැමිණි බවත්, නැවත කිසිදිනෙක එවැනි බලයකින් නොපැමිණි බවත්ය.

නැවුම් ලෙස සපයාදීම

ක්‍රියා 4: 31 වෙත හැරෙන්න. එවිට ඔවුන් සිටි ස්ථානයට දෙවෙනි වරටත් ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි බව ඔබට පෙනෙනු ඇත. උන්වහන්සේ එම ස්ථානය කම්පාකර ඔවුන් සියල්ලන්ව මෙම බලයෙන් පිරවූසේක. කාරණය නම් අපි කාන්දුවන භාජනවන අතර ක්‍රිස්තුස් වහන්සේගෙන් පිරීසිටීමට සහ නැවුම් සැපයුමක් ලබාගැනීමට අපි සෑමවිටම දිය උල්පත යටතේ සිටිය යුතුය. අපි අතරේ බොහෝ දෙනෙක් කරන වැරැද්දක් නම්, දෙවියන් වහන්සේ අපට වසර දහයකට පෙර ලබාදුන් කරුණාවෙන් තවමත් දෙවියන් වහන්සේගේ කාර්‍යය ඉටුකිරීමට උත්සහ කිරීමයි. අපට අවශ්‍යය වන්නේ නැවුම් සැපයුමක්, නැවුම් ආලේපයක් සහ නැවුම් බලයකි. අපගේ මුළු හදවතින්ම එය සොයන්නේ නම් අපට එය ලැබෙනු ඇත.

පළමු සභාවේදී කිතුණුවන්වූ අයට එම බලය සෙවීමට ඉගැන්වූහ. පිලිප් සමාරියට ගිය අතර සමාරියේ විශාල කාර්‍යයක් සිදුවෙමින් පවතින බවත් කිතුණු ආගමට හැරුණු අය සිටින බවත් යෙරුසලමට ආරංචි විය. ප්‍රේතුස් සහ යොහාන් එහි ගොස් කිතුණු ආගමට හැරුණු අය මත අත් තැබූ අතර සේවය කිරීම සඳහා සමාරියේ අය මත ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පැමිණිසේක. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනග වන සභාව ගොඩනැගීමේදී සහ උන්වහන්සේගේ මහිමය ප්‍රකාශකිරීමේදී අපව බලවත් ලෙස පාවිච්චිකරන පිණිස සේවය සඳහා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේව ලබාදෙනසේක. කිතුණුවන් වන අප සෙවිය යුත්තේ එයයි. සභාව මෙම දැනගැන්ම පසෙකට දමාඇති බවත්, එය කොතැනකදී හෝ වරද්දාගෙන ඇති බවත්, එබැවින් කිතුණුවන් බලය නොමැතිව සිටින බවත් මම තරයේ විශ්වාස කරමි. සමහරවිට ඔබට සමාරිතයන් සියයක් සභාවට ගෙනඒමට හැකි අතර එසේවූවත් ඔවුන්ව එහි බලයට එකතු නොකරයි. ඒ සියල්ල වැරදිවේ. ඔවුන් සියල්ලන් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ විසින් අභිෂේක කරනු ලැබුවේ නම්, ගැළවීමට පැමිණියාවූ සියයක් සභාවට එකතු කිරීමෙන් විශාල බලයක් ලැබෙනු ඇත.

පිපාසයෙන් සිටින අය වෙතට ජීවනදයක වතුර වත්කළසේක

වර්ථමානයේ සභාවේ බොහෝ දෙනෙක් අඳුරු (මළානික) කාන්තාර මෙන්වේ. සියල්ල වියළී පාළුවට ගොස් ඇත. එමෙන්ම පෙනෙන ආකාරයට ඔවුන් තුල ජීවයක් නැත. දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පිරුණාවූ **"බේ"** ගසක් වැනි ඵලදරන මනුෂ්‍යයෙක් අසල ඔහු වාඩිවීසිටිය හැකි නමුත් ඔවුන් ඒ හා සමාන ආශිර්වාදයක් සොයන්නේ නැත. මේ වෙනස කුමක්ද? පිපාසයෙන් සිටි තැනැත්තාට දෙවියන් වහන්සේ වතුර වත්කළ සේක. වෙනස එයයි. යමෙක් දෙවියන් වහන්සේගේ මෙම අභිෂේක කිරීම සොයමින් සිටි අතර ඔහුට එය ලැබීඇත. අපට මෙය අන් සියල්ලටම වඩා අවශ්‍යයවූ විට දෙවියන් වහන්සේ එය අපට ලබාදෙනු ඇත. දැන් අප ඉදිරියේ ඇති විශාල ප්‍රශ්ණය වන්නේ අපට එය අවශ්‍යයද යන්නයි.

මම මුලින්ම එංගලන්තයට ගිය අවස්ථාවේදී බයිබලය කියවමින් දේශනයක් කළෙමි. මම මුල්වරට එය කරනවිට එතැන දේවසේවකයන් විශාල සංඛ්‍යාවක් සිටියා. මම ඉංග්‍රීසි අයගේ දේවධර්මය ගැන කිසිවක් දැනසිටියේ නැහැ. ඒ වගේම මම ඔවුන්ගේ ඇදහිල්ලට විරුද්ධව කටයුතු කරයි කියලා මම භයවුනා. විශේෂයෙන් සේවය සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ මෙම බලයේ දීමනාව නැමති විෂය ගැන කථාකරද්දී මට ටිකක් බාදවුණා. එහි සිටි ක්‍රිස්තියානි දේවසේවකයෙක් ඔහුගේ හිස අතගගා සිටියා මම සිතුවා මේ යහපත් මනුෂ්‍යයා මම කියන හැමදේටම ලැජ්ජාවෙනවා කියලා. ඇත්තවශයෙන්ම ඒක මට කරදරයක්ව තිබුණා. මගේ කථාව අවසානයේ ඔහු ඔහුගේ හිස්වැසුමත් අරගෙනගියා. ඊටපස්සේ මම හිතුවා ඔහුව නැවත කවදාවත් දකින්න ලැබෙන එකක් නැහැ කියලා. ඊළඟ රැස්වීමේදී මම ඔහුව සෙව්වා ඔහු සිටියේ නැහැ. ඉන්පසුව පැවති රැස්වීමේදීත් මම නැවතත් ඔහුව සෙවුවා නමුත් ඔහු පැමිණ සිටියේ නැහැ මගේ ඉගැන්වීමට ඔහු අමනාප වෙන්න ඇති කියලා මම සිතුවා. නමුත් දින කිහිපයකට පසු විශාල යාච්ඤා රැස්වීමක් පැවැත්වූ අවස්ථාවේදී එක් මනුෂ්‍යයෙක් නැගී සිටියා ඔහුගේ මුහුණ දෙවියන් වහන්සේ සමග ඉතා සමීපව ඇසුරුකල කෙනෙකු මෙන් බැබළුණා. මම ඔහුදෙස බැලුවෙමි. මට මහත් ප්‍රීතියක් වූයේ ඒ මම සෙවූ සහෝදරයාය. ඔහු මගේ පළමු බයිබල් කියවීමේදී සිටිබව පැවසූ අතර සුභාරංචිය දේශනා කිරීමට නැවුම් බලයක් ඇතිබව එහිදී ඔහුට ඇසුණු අතර එය තමාට නම්, එය තමාට ලැබෙනු ඇතැයි ඔහු විශ්වාස කළේය. ඔහු නිවසට ගොස් ස්වාමීන්වහන්සේ දෙස බැලූ අතර ඔහුගේ ජීවිතයේ කිසිම දවසක තමා සමග එවැනි සටනක් තිබුණේ නැත. ඔහු කිසිවිටෙකත් නොදන්නා ඔහුගේ හදවතේ පව්කාර බව පෙන්වන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. ඔහු තමාවම හිස්කරගෙන ආත්මයෙන් පිරියන ලෙස දෙවියන් වහන්සේට බලවත්ලෙස මොරගැසුවේය. ඔහු පැවසුවේ දෙවියන් වහන්සේ මගේ යාච්ඤාවට පිළිතුරු දුන්සේක කියාය.

ඒ දවසේ සිට මාස හයක් **"එඩින්බරෝහිදී"** මට ඔහුව මුණගැසුණි. ඒ කාලය තුල සෑම රාත්‍රියකම ඔහු සුභාරංචිය දේශනාකළා කියා ඔහු මට කීවේය. කලින් ඔහු එක දේශනාවක්වත් කළේනැහැ. සමහරු සංවාද සඳහා රැඳිසිටියා. ඔහු මෙම ආලේපය ලැබීමට පෙර කිසිවෙකුට පිළිතුරු ලබාදීමට නොහැකිව සිටියා, දැන් කාලතුවක්කු ප්‍රහාරයක් එල්ලකළාක් මෙන් පිළිතුරු දෙමින් සිටියයි. මුළු සභා ගොඩනැගිල්ල සෙනගගෙන් පිරී ඉතිරියාමට දින තිහක්වත් ගතවුනේ නැහැ. ඔහුගේ ජීවිතය ජීවන ජලයෙන් පිරිතිබුණා. මනුෂ්‍යයන් එය දැනගෙන සෑම ප්‍රදේශයකින්ම ඔහුවෙත රොක්වුනා. ඔබට දිය උල්පතට වඩා ඇළ ඉහළට ගෙනයාමට නොහැකිය. අපට විශේෂයෙන් අවශ්‍යය වන්නේ බලයයි.

මගේ මතකයේ තවත් වැඩිහිටි දේවසේවකයෙක් සිටියා. ඔහු කිව්වා, මට හෘර්දරෝග යක් තියෙනවා, ඒ නිසා මට සතියකට එක වතාවකට වඩා දේශනා කරන්න බැහැ කියලා. එබැවින් ඔහු වෙනුවෙන් දේශනා කිරීමට සහ බැහැදැකිම කරන්න ඔහුගේ සඟයෙක් සිටියා. මේ අභිෂේක කිරීම ගැන වැඩිහිටි දේවසේවකයා අසා තිබුණා. ඔහු මෙහෙම කිව්වා, මගේ භූමිදණය සඳහා මම අභිෂේක ලැබීමට කැමතියි. එහෙත් මම යන්න කලින් සුභාරංචිය බලයෙන් යුතුව දේශනා කිරීමට තවත් එක් වරක් වරප්‍රසාදය ලබාගැනීමට මම කැමතියි. දෙවියන් වහන්සේ තමාව ආත්මයෙන් පුරවන ලෙස ඔහු යාච්ඤා කළේය.

ඊට ටික කාලයකට පස්සේ මම ඔහුව මුණගැසුණා. ඔහු කිව්වා, **"මම සතියකට සාමාන්‍යයෙන් අටවතාවක් දේශනා කළා ඒ වගේම මට ගැළවීමට පැමුණුන අයවත් දකින්නට ලැබුණා කියලා"** ආත්මයාණන් වහන්සේ ඔහු කෙරෙහි පැමිණියා. තෙල් සහ ග්‍රීස් නොමැතිව යන්ත්‍රෝපකරණ භාවිතාකිරීමෙන් මනුෂ්‍යයන් වෙහෙස මහන්සිවී වැඩකිරීමෙන් බිඳවැටී සිටින බව මම විශ්වාස නොකරමි. දේවසේවකයන් බිඳවැටෙන්නේ වෙහෙස මහන්සිවී වැඩකිරීමෙන් නොව, බලය නොමැතිව වෙහෙස මහන්සිවී වැඩ කිරීමෙනි.

අහෝ, දෙවියන් වහන්ස, ඔබවහන්සේගේ සෙනගව ආලේප කළමැනව. දේව සේවය සඳහා පමණක් නොව සෑම ගෝලයෙකුවම ආලේප කිරීම අවශ්‍යයව තිබේ. එය අවශයය වන්නේ දේවගැතිවරයාට පමණක්යයි නොසිතන්න. මවකට තම පවුලේ කටයුතු සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලේපය අවශ්‍යයවේ. දේවගැතිවරයාට දේශනා කුඩුවේදී මෙන්ම, සබත් පාසැල් ගුරුවරයාට සබත් පාසලේදී එය අවශ්‍යයවේ. අප සියල්ලන්ටම එය අවශ්‍යයව තිබේ. අපි එය හිමිකරගන්නා තුරු දිවා රෑ දෙකෙහිම විවේක නොගන්නෙමු. එය අපගේ හදවත් වල ඉහළම සිතුවිල්ල නම්, අපි ඒ සඳහා පිපාසයෙන් සිටියොත් දෙවියන් වහන්සේ එය අපට ලබාදෙනසේක. දෙවියන් වහන්සේ මට පිහිටවෙනසේක. ඉහළින් පැමිණෙන බලයෙන් පිරෙනතුරු මම විවේක නොගන්නෙමි.

"ඩී. එල්. මූඩි විසින් රචිත "බලයේ රහස" නැමති පොත ඇසුරෙන් සකස්කරන ලදි."

"...,නුමුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම් වලින් අප උදෙසා මැදහත්කම් කරනසේක." (රෝම 8: 26)

Reg. No: DOP/MAGAZINE/28/2026
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

පසුගිය කලාපයෙන්

පවිත්‍රකාර ලෝකයක ශුද්ධවූ ගමනක්...

නමුත් මේවා ජීවිතයේ සාමාන්‍යය තත්වයන් වන අතර ඉක්මනින් පහවයයි. ඒවා කිසියම් අර්ථයකින් ඔබගේ පැවැත්මේ අරමුණ නම්, ඔබ ලෞකිකයෙකි. ඒවා සහකරුවන් පමණක් වියයුතුය. එබැවින් දෙවියන් වහන්සේ තම ත්‍යාගයෙන් ලබාදීඇති සෑම රුචියක්ම සහ තෘප්තියක්ම සෑමවිටම සේවකයෙකුවීම, උසස් අරමුණක මෙහෙකරුවෙකුවීම මිස අප ජීවත්වන අරමුණ හෝ ඉලක්කය නොවේ.

ඇස්වල තෘෂ්ණාව

ඇස්වල තෘෂ්ණාව යන්නට ඇඳුම් පැළඳුම් වලට ඇති ඇල්ම, උපකරණ වලට ඇති ඇල්ම, ගෘහ උපකරණවලට ඇති ඇල්ම, අලංකාරයට ඇති ඇල්ම වැනි ලෞකික ප්‍රදර්ශනයේ සමස්තයම ඇතුලත්වේ. මේවා ඔබව පාලනය කරනවිට, ඔබ කෙරෙහි කේන්ද්‍රගතවූ විට සහ ඔබේම ආත්ම අභිමානයට හා උඩඟුකමට සේවය කරනවිට ඒවා තහනම් ලෝකයයි. දෙවියන් වහන්සේ දේවල් ලස්සන කරයි. අපට ඒවා ගැන දෙවියන් වහන්සේට ස්තුති කළහැකිය. නමුත් අපි ඒ දේවල්තුලම රැඳීසිටියයුතු නැත. නමුත් සියල්ලෙන් දෙවියන් වහන්සේ වෙතට ගොස්, සියල්ල උන්වහන්සේගේ මහිමයට හේතුවක් කරගෙන උන්වහන්සේගේ පූජාසනය මත සිට නමස්කාර කළයුතුය.

ජීවිතයේ අහංකාරකම

ජීවිතයේ අහංකාරකම යනු ලෞකීකත්වයේ, පවුලේ ආඩම්බරයේ, සංස්කෘතියේ ආඩම්බරයේ, දක්ෂතාවයේ ආඩම්බරයේ හෝ ජීවිතයේ අභිලාෂ සහ සාර්ථකත්වය රූප වන්දනාවේ වස්තූන් බවට පත්කිරීමට ඔබව යොමුකරන ඕනෑම පුද්ගලික ගුණාංගයකි. සමහරවිට අද සියල්ලටම වඩා භයානකවන්නේ වාණිජ බලයේ ආඩම්බරයයි. මක්නිසාද අද ලෝකය පාලනයකරන මිනිසුන් අපගේ වාණිජ රජවරුන් වන අතර මනුෂ්‍යයාගේ හදවත් දැඩිකරන, මිනිස් ස්වාභාවය යක්ෂාවේශ කරන ආශාව මුදල් වලින් ලබාදෙන බලයට ඇති ආදරයයි.

ඔබගේ කුඩා ලෝකයේ ඔබට එය තිබිය හැක්කේ කෝටිපතියෙකුට ඔහුගේ ලෝකයේ තිබෙන ආකාරයටමය. වහා ගිනිඇවිලෙන දේවල් සහ ගින්න යන දෙකම මාර්ගයෙන් ඉවත්කළයුතුය. ලෝකය වහා ගිනි ඇවිලෙන දේවල්ය. රාගය යනු ගින්නයි. දෙවියන් වහන්සේට අවශ්‍යය වන්නේ උන්වහන්සේගේ ප්‍රේමය, පාරිශුද්ධත්වය, බලාපොරොත්තුවේ ලෝකය, සහ යේසුස් වහන්සේ රජකම්කරන පොළොවට ලබාදියහැකි පොහොසත්ම මැනිය නොහැකි තරම් ශ්‍රේෂ්ඨත්වය පිළියෙලකරන, ඉදිරියේදී එන රාජ්‍යයට අපව විවෘත කිරීමෙන් අපව වෙන්කර ගැනීමයි. මෙය වර්තමාන නපුරු ලෝකයට ප්‍රතිවිරුද්ධතාවය දක්වනු ඇත.

වේචාට විෂනාශක ඖෂධය දෙවියන් වහන්සේගේ ප්‍රේමයයි

මාංශයේ ආශාවට සහ ලෝකයට ප්‍රේමකිරීමට ප්‍රතිවිරෝධී ඖෂධය දෙවියන් වහන්සේගේ ප්‍රේමයයි. මෙහිදී ලෝකයට සහ එහි ආකර්ෂණයට ප්‍රතිවිරුද්ධව දෙවියන් වහන්සේ අපට තවත් ආකර්ෂණයක් පෙන්වයි. එය පහළදේට ප්‍රතිවිරුද්ධව සහ සමතුලිතකරන ඉහළ ආකර්ෂණයකි. යුග ගණනාවක් පුරා කළාවේ, කවියේ, ඉතිහාසයේ සහ කාලයේ කථාවේ සුන්දර සියල්ලටම චමත්කාරය ලබාදුන් පැරණි ආදර කථාවයි. ආදරයේ චමත්කාරය සඳහා පවුල, ධනය සහ සෑම භූමික දෙයක්ම අත්හැරීමට කැමති මිනිස් හදවතේ ඇති ප්‍රේමය, ඒ පූජනීය ගින්න අල්ලා ගන්නේනම්, එහි සෑමවිටම ස්වර්ගයෙන් පැමිණි බව පෙනෙන අලංකාර දෙයක් තිබේනම්, එය වෙනත් කිසිදු භූමික චේතනාවකට ලබාදිය නොහැකි වීරත්වය, පරිත්‍යාගය සහ ජීවිතයේ උදාරත්වය දක්වා ඔසවනු ලබයි.

දැන් මිදීමේ රහස පැරණි ප්‍රේමයේ කථාවමයි. යුග ගණනාවකට පෙර එම කථාව දෙවියන් වහන්සේගේ හදවතේ සහ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් ආරම්භ විය. උන්වහන්සේ තම දිළිඳු, නැතිවූ මනමාලිය දිනාගැනීමටත්, ඇයව උන්වහන්සේගේ මහිමයට සහ උන්වහන්සේගේ සිංහාසනයට ඔසවා තැබීමටත් සොයන ස්වර්ගීය මනමාලයාය. එසකියෙල් 16: වන පරිච්ඡේදයේදී උන්වහන්සේ ඇගේ රුධිරයේදී ඇයව සොයාගත් චිත්‍රය අපට ලබාදී ඇයට **"ජීවත්වෙන්න"** යැයි පැවසූසේක. ඉන්පසු ඇයව සෝදා පිරිසිඳු අලංකාර ඇඳුම්වලින් ඇයව පළඳවා, සෑම වටිනා ආභරණයකින්ම ඇයව අලංකාර කරමින් තවදුරටත් මෙසේ පැවසූසේක. **"ඔබ මගේ විය"**

ආබ්‍රහම්ගේ ප්‍රධාන සේවකයා (එළියේසර්) ආබ්‍රහම්ගේ උරුමක්කාරයාට මනමාලියක් සොයාගැනීමට දුර රටකට ගොස් ඇගේ කැමැත්ත දිනාගනිමින්, ඇගේ අලංකාර ඇඳුම් සහ ඉතා අනර්ඝ ආභරණ ඇයට ලබාදී පසුව ඇයව ඇයගැන මගබලාසිටි ඇගේ මනමාලයා වෙතට ඔහුගේ නිවසට ගෙනආවාක්මෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ, යේසුස් වහන්සේගේ මනමාලියට උන්වහන්සේගේ ප්‍රේමය පිළිගැනීමට සහ පසුව උන්වහන්සේගේ පැමිණීමට ඇයව කැදවීමට සූදානම්කිරීම සඳහා ඉදිරිපත් වූසේක. යුග ගණනාවක් පුරා උන්වහන්සේගේ හඬනම්, **"දියණියෙනි, අසව, කල්පනාකරව, කන් යොමුකරව, නුඹේම සෙනඟත් නුඹේ පියාණන්ගේ ගෙදරත් සිහිනැතිකරව. එවිට රජතෙම නුඹේ රූපශ්‍රියට ආශාවෙයි. මක්නිසාද උන්වහන්සේ නුඹේ ස්වාමිය. උන්වහන්සේට නමස්කාර කරව."** (**ගීතාවලිය 45:10-11**)

රෙබෙකාගේ හදවතේ අවදිවූ ආදරයේ සහ බලාපොරොත්තුවේ නව ලෝකය ඇගේ පියාගේ නිවස සහ ඇගේ ළමාකාලයේ නිවස අමතක කිරීමට ශක්තිය ලබාදුන්නේය. වර්ථමානයේ මෘදු තරුණියන්ට නව චමත්කාරය අවදිවන විට පැරණි ආකර්ෂණයන්, ඇගේ ළමාකාලයේ දර්ශනයන්, ඇගේ මුල්ම සහ ආදරණීය සෙනෙහස ඇති නිවස අතහැරදමා ඇය අවට සිටින සියල්ලන්ටම වඩා හොඳින් තමාට ආදරයකරන කෙනෙකු වෙනුවෙන් කාන්තාරයේ, සාගරයේ, හමුදු කඳවුරේ, දරිද්‍රතාවයේ සහ අසීරුකම්වලට මුහුණදීමට නිර්භීත වියහැකිය. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය හිමිකරගත් පසු ආත්මාර්ථකාමීත්වයට සහ ලෞකිකත්වයට ප්‍රතිවිරුද්ධව ක්‍රියාකරන අතර දෙවියන් වහන්සේට කැපවූ ජීවිතයක් ගතකිරීම ප්‍රධාන ආශාව බවට පත්වේ.

ශුද්ධාත්මයාණන් වහන්සේ ඉල්ලා සිටින්නේ මෙයයි. උන්වහන්සේගේ ඊර්ෂ්‍යා සහගත ප්‍රේමයට කිසිදු පහත් ප්‍රකාශයක් අපගේ හදවත් වලට අවශෝෂණය කරගැනීම (ඇතුළු කරගැනීම) හෝ ක්‍රිස්තුස් වහන්සේගේ උත්තරීතරභාවය අපගේ හදවත්වලින් බැහැරකිරීම දරාගත නොහැකිය. එබැවින් උන්වහන්සේ අපට ඊර්ෂ්‍යා සහගතව ප්‍රේමකරන අතර (වෙනදෙයකට අපගේ ලැදිවීමට නොකැමතිව) ප්‍රතිවාදී ආකර්ෂණයන් සහ ලෝකයේ පොළඹවන ආකර්ෂණයන් පිළිබඳව දැඩිලෙස සංවේදීව ක්‍රියාකරනසේක. උන්වහන්සේට එවැනි එදිරිවාදිකම් දරාගත නොහැකිය. උන්වහන්සේ අපට ඊර්ෂ්‍යා සහගතව ප්‍රේමකරන අතර උන්වහන්සේගේ ඊර්ෂ්‍යාව දැවෙන ගින්නක්මෙන් දැල්වෙයි.

විශුද්ධකරණය යන විෂය සම්බන්ධයෙන් රෝම 7; වන පරිච්ඡේදයේ පාවුල් තුමා විවාහය තුල ඇති ඒකත්වය යටතේ නිරූපණය කරනබව දැකීම ඉතා සිත්ගන්නා කරුණකි. **"පුරුෂයෙකු ඇති ස්ත්‍රී පුරුෂයා ජීවත්ව සිටිනතෙක් ව්‍යවස්ථාවෙන් ඔහුට බැඳීසිටින්නීය. නුමුත් පුරුෂයා මැරුනොත් පුරුෂයාට බැඳීසිටි ව්‍යවස්ථාවෙන් ඇය මිදී සිටින්නීය. පුරුෂයා ජීවත්ව සිටියදී ඇය අන්පුරුෂයෙකුට බැඳුනොත්, ඇය කාමච්ඡාචාරිනියක්යයි කියනු ලබන්නීය. නුමුත් පුරුෂයා මැරුණු පසු ඇය අන්කෙනෙකුට බැඳුනත්, ඇය කාමච්ඡාචාරිනියක් නොවන ලෙස ඒ ව්‍යවස්ථාවෙන් නිදහස්ව සිටින්නීය. එබැවින් මාගේ සහෝදරයෙනි, අප විසින් දෙවියන් වහන්සේට ඵල උපදවන පිණිස නුඹළාද අන්කෙනෙකුට එනවි, මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවාවූ තැනැත්වහන්සේට බැඳී, ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය කරුණුකොටගෙන ව්‍යවස්ථාවට මළඅය කරනු ලැබුවහුය."** (**රෝම 7:2-4**)

ශුද්ධකම යනු ක්‍රිස්තුස් වහන්සේ සමග විවාහවීමේ ප්‍රතිඵලයකි. ප්‍රේමණීය ජීවිත දෙකක එකමුතුවෙන් නිරායාසයෙන්ම දරුවන් බිහිවෙන්නාක්මෙන්, ජීවමාන මිදිවැලෙන් ඵල වර්ධනය වන ආකාරයටම ඇදහිල්ල, ශුද්ධකම, ඉවසීම, ඇදහිලිවන්තයාගේ යහපත් ක්‍රියා යන සියල්ල ස්වාමීන්වහන්සේගේ ප්‍රේමණීය ජීවිතයෙන් හටගන්නේය. ඒවා තම උත්සහයෙන් පැළඳගත නොහැකිය. නමුත් ඒවා ජීවිතයට අත්‍යවශ්‍යය වන අතර ජීවිතයේ සහ ප්‍රේමයේ අභිප්‍රායෙන් යුතු බලයෙන් පොළඹවනු ලබයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ආයාචනා කරන්නේ අපගේ ප්‍රේමයට වනසේක. උන්වහන්සේ අපතුල කරුණාවේ ක්‍රියාව ක්‍රියාත්මක කරන්නේ ප්‍රේමයෙනි. ලෝකය පළවාහරින ලෙංගතුකමකට පොළඹවන බලය එයයි.

ඉතිරි කොටස ඊලඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.